*Sri Lanka Journal of Social Sciences 2025* ***48****(1): 39-53*
*DOI: https://doi.org/10.4038/sljss.v48i01.9131*

**RESEARCH ARTICLE**

# Cultural Context and Folk Consciousness of Folk Instruments: An Exploration of the Sri Lankan Traditional Folk Instrument "Kulla" (Winnowing Fan)

## ශ්‍රී ලාංකේය ජනමෙවලම් හා තදනුබද්ධ සංස්කෘතික සංදර්භය හා ජනවිඥානය: කුල්ල ආශ්‍රිත සංස්කෘතික අධ්‍යයනයක්

**Swarna Ihalagama[1*], Wasantha Subasinghe[2] and Priyanwada Wanigasooriya[3]**

[1*] *Department of Sinhala, Faculty of Humanities, University of Kelaniya, Sri Lanka.*
[2] *Department of Sociology, Faculty of Social Sciences, University of Kelaniya, Sri Lanka.*
[3] *Department of Library and Information Science, Faculty of Social Sciences, University of Kelaniya, Sri Lanka.*

**Abstract:** This research paper delves into the traditional Sri Lankan tool known as 'Kulla' (Winnowing Fan) exploring its cultural significance, historical context, and various applications in the daily lives of the Sinhalese people. The study reveals the intricate connections between the Kulla and the Sri Lankan cultural heritage, highlighting its multifunctional use in culinary, medicinal, and construction activities. Through a comprehensive analysis of traditional practices and material culture, the research documents how the Kulla, primarily made from natural resources like bamboo, palm leaves, and reeds, plays a vital role in sustenance of rural livelihoods and the preservation of artisanal skills. By examining the production techniques, usage patterns, and the socio-cultural context of the Kulla, the paper provides valuable insights into the continuity and evolution of traditional Sri Lankan craftsmanship. The findings underscore the importance of preserving these traditional tools and the knowledge associated with them, emphasizing their relevance in contemporary society as a symbol of cultural identity and heritage. This study not only contributes to the academic understanding of Sri Lankan traditional practices but also advocates for the recognition and support of indigenous knowledge systems in the face of modernization and globalization.

*Keywords:* Kulla, national heritage, Sinhala culture, Sri Lanka

## හැඳින්වීම

ඕනෑම සමාජයක වෙසෙන ඕනෑම ජන කණ්ඩායමක් විසින් කාලයක් තිස්සේ පරිහරණය කරනු ලබන ආහාර-පාන, ඇඳුම්-පැළඳුම්, වාසස්ථාන සහ විවිධ විෂයක අවශ්‍යතා උදෙසා ඔවුන් විසින් සකසා ගැනුණු භාණ්ඩ, උපකරණ හා මෙවලම් මඟින් මෙන් ම ව්‍යවහෘත භාෂාව මඟින් ද ඔවුන්ගේ සංස්කෘතියේ සජීවාත්මක පැතිකඩක් අනාවරණය කරගත හැකිය. 'සංස්කෘතිය' පිළිබඳ පළමු ශාස්ත්‍රීය අර්ථකථනය ඉදිරිපත් කළ බ්‍රිතාන්‍ය ජාතික මානව විද්‍යාඥ ඊ. බී. ටයිලර් ඔහුගේ Primitive Culture (1871) කෘතියෙන් 'සංස්කෘතිය' නිර්වචනය කරන්නේ, "සංස්කෘතිය හෝ ශිෂ්ටාචාරගත වීම පුළුල් වූ මානව වංශලේඛන අර්ථයකින් ගත් කල පුද්ගලයෙකු යම්කිසි සමාජයක සාමාජිකයෙකු ලෙස ලබාගන්නා දැනුම, විශ්වාස, කලාව, සදාචාරය, නීතිය, චාරිත්‍ර සහ අනෙකුත් හැකියා සහ පුරුදු ඇතුළත් සමස්තය" යනුවෙනි (Tylor, 1871, p. 1). ක්‍රෝබර් සහ ක්ලක්හෝන් (1952) මේ සම්බන්ධ සංකල්ප හා නිර්වචන 164 ක් පමණ විමර්ශනය කර ඇත. ඔවුන් සංස්කෘතියෙහි ලක්ෂණ පහත පරිදි විස්තර කරන බව ක්ලක්හෝන් (1949) උපුටා දක්වන ස්මෙල්සර් (1984, p. 19) දක්වා ඇත. ඒ අනුව, සංස්කෘතිය යනු ජනතාවගේ සමස්ත ජීවන ක්‍රමය වන අතර පුද්ගලයා සිය සමාජ උරුමය තම සමූහයෙන් ලබා ගන්නකි. පුද්ගලයා සිතන ආකාරය, වින්දනය කරන ආකාරය සහ විශ්වාස, ඉගෙනුම් චර්යාව, බාහිර පරිසරය හා මිනිසුන් හඳුනාගන්නා උපකරණය සහ චර්යා සිතියම සංස්කෘතිය වේ.

ඒ අනුව මිනිසාගේ හැසිරීම ජීව විද්‍යාත්මක ගොඩනැගුමක් නොවන අතර එයට බලපාන ප්‍රධාන සාධකය වන්නේ සංස්කෘතියයි (Kluckhon, 1949). සංස්කෘතිය සහ සමාජය යනු එකිනෙකට බැඳී ඇති සංකල්ප වන අතර, එහිදී සංස්කෘතිය යන පුළුල් සංකල්පයට කිසියම් කණ්ඩායමක බෙදාගත් විශ්වාසයන්, වටිනාකම්, භාවිතයන් සහ පෞරාණික මෙවලම්

* Corresponding author (swarnai@kln.ac.lk; https://orcid.org/0009-0007-8924-742X)

This article is published under the Creative Commons CC-BY-ND License (https://creativecommons.org/licenses/by-nd/4.0/). This license permits use, distribution and reproduction, commercial and non-commercial, provided that the original work is properly cited and is not changed in anyway.

ඇතුළත් වන අතර, සමාජය යනු එකී පොදු සංස්කෘතියක් බෙදා ගන්නා සහ නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් තුළ අන්තර් ක්‍රියා කරන පුද්ගලයින්ගේ කණ්ඩායම් වේ. සමාජයක් බිහිවීමේ සිටම සංස්කෘතියක් එකට උපත ලබා ඇතැයි පැවසේ (Maung, 2023). එනයින් සාම්ප්‍රදායික සිංහලයින්ගේ සංස්කෘතිය ද සම්පූර්ණයෙන් ම පාහේ පරිසරය හා තදනුබද්ධ ගහකොළ සහිත ස්වාභාවික පරිසරය කේන්ද්‍රීයව ගොඩනැගුණකි (Bater, 1874/2004; Brohier, 1973/2002; Leach, 1961). සිංහල සංස්කෘතියේ ආරම්භය සිදුවන්නේ පණ්ඩුකාභය රජ සමයෙනි. හේ වැව් තැනවීමේ පුරෝගාමී රජතුමා ලෙස සැලකේ (Medhananda Himi, 2006, p. 42). පොදු කාර්යයන් සඳහා ජනයා ඒකරාශීකර ගැනීම සිදු වූයේ වැව් තැනීමේදී හා කෘෂිකර්මික ක්‍රියාකාරකම්වලදී ය (Wickramasinghe, 2006, p. 26). පැරණි ලාංකිකයන් ඇඳුම්-පැළඳුම්, වාසස්ථාන මෙන් ම භාණ්ඩ, උපකරණ හා මෙවලම් ද සකසාගෙන ඇත්තේ ස්වාභාවික පරිසරයට ප්‍රමුඛස්ථානය ලබාදෙමිනි. ඔවුන් විසින් ගෘහීය සහ කෘෂිකාර්මික අවශ්‍යතා උදෙසා නිර්මාණය කරගෙන ඇති පැදුර, කළය, පහන, කුරහන්ගල, මිරිස්ගල, වංගෙඩිය, මෝල්ගස හා කුල්ල වැනි භාණ්ඩ, උපකරණ හා මෙවලම් මඟින් නියෝජනය වන්නේ හුදු භෞතික සංස්කෘතිය පමණක් නොවේ; ඒවා මඟින් ඔවුන්ගේ අභෞතික සංස්කෘතිය ද අනාවරණය වන්නේය. කුල්ල ඒ අතර සුවිශේෂී මෙවලමක් ලෙස හැඳින්විය හැකි ය.

කුල්ල යන වචනය සිංහල භාෂාවට ප්‍රවිෂ්ට වීම සම්බන්ධ ව පළ වී ඇති ප්‍රථම මතවාදය ඇතුළත් වන්නේ ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය කෘතියෙහි ය; "අප දන්නා ආර්ය හෝ අනාර්ය එක ද භාෂාවකින් ලැබිණැයි කිය නොහැකි ඇතැම් ලක්ෂණ ද සිංහල භාෂාවෙහි, එයිනුදු වෙසෙසින්මත් වචනමාලාවෙහි දක්නට ලැබෙයි. ඒ ලක්ෂණ ආර්යයන් පැමිණීමට පෙර කාලවලට සම්බන්ධ යයි සිතිය හැකිය. ඇපය, ඔළුව, කකුල, කට, කළව, කුල්ල, තොල, පැදුර, පොත්ත, බඩ...." (University of Kelaniya, 1964, p. 36) යනාදි වශයෙන් දැක්වෙන එකී වචන සමූහයට කුල්ල ද අන්තර්ගතවී තිබීම අනුව, එය සිංහල භාෂාවේ නිෂ්පන්න වචනයක් වශයෙන් හඳුනාගත හැකිය. ඒ අනුව කුල්ල හා එහි භාවිතය සිංහලයින්ගේ ශිෂ්ටාචාරයේ සමාරම්භය දක්වාම දිවෙන බව පැහැදිලි ය.

කුල්ලේ සම්භවය පිළිබඳ විවිධ මතිමතාන්තර ලිඛිතව මෙන් ම ජන විශ්වාස අතර ද පවතී. විශේෂයෙන් ම සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජය හා තදනුබද්ධ, ප්‍රභවය පිළිබඳව නිශ්චිතව සඳහන් කළ නොහැකි ඇතැම් සංසිද්ධි, චාරිත්‍ර-වාරිත්‍ර, භාණ්ඩ, උපකරණ හා මෙවලම් මහාසම්මත යුගයට, දිව්‍යලෝකවලට හෝ අසුරලෝකවලට හෙවත් අපායවලට සම්බන්ධකොට තිබීම විශේෂ ලක්ෂණයකි. ඒ අනුව කුල්ලේ සම්භවය සිදුවී ඇත්තේ අසුර භවනයෙහි ය යන්න එක් විශ්වාසයකි (Karunarathna, 2001, p.150). මේ අනුව කුල්ලෙහි ප්‍රභවය සම්බන්ධයෙන් කාලනිර්ණය කිරීම නිශ්චිතව ම සිදු කළ නොහැකි බවත් අනාදිමත් කාලයක පටන් ම එය ශ්‍රී ලාංකියන් විසින් පරිහරණය කරන ලද බවත් පැහැදිලිවේ. කුල්ල සාම්ප්‍රදායික ශ්‍රී ලාංකිකයන්ගේ ගොඩ ගොවිතැන හෙවත් හේන් ගොවිතැන හා මඩ ගොවිතැන හෙවත් කුඹුරු ගොවිතැන යන ප්‍රභේද ද්වයය සමග ම මෙන්ම දෛනික ගෘහීය කටයුතු සමග ද අත්‍යන්තයෙන් ම බැඳී පැවතුණි. එහි පෞරාණිකත්වය ඓතිහාසිකව සනාථ කළ හැකි සාක්ෂ්‍ය අනුව දුටුගැමුණු රජ සමය දක්වා දිවෙයි. එතුමා, රුවන්වැලිසෑය ගොඩනැගීම සඳහා පස් සකස් කරගන්නා ආකාරය පිළිබඳ ගෘහ නිර්මාණශිල්පියකු සමඟ සිදු කළ සාකච්ඡාවේදී එම ශිල්පියා විසින් සිදු කරනු ලැබ ඇති පැහැදිලි කිරීම උදෙසා මහාවංශයේ පහත පරිච්ඡේදය මනාව සෑහේ.

"ඉක්බිති පණ්ඩිත ව්‍යක්ත වූ උළු වඩුවෙක් තෙම (කියන්නේ) වනෙහි කොටවා කුල්ලෙන් වැඩූ කල්හී මම දා ගලෙහි අඹරවා මැටි අමුණක් (එක දවස ගෙවන්නෙමි) මෙහි චෛත්‍යයෙහි තෘණාදීහුද නොවන්නාහු" (Mahawanmsa, 2004, chapter 30).

රුවන්වැලිසෑය ඉදිකිරීම මෙරට වාස්තුවිද්‍යාවේ හෙවත් ගෘහනිර්මාණ ශිල්පයේ ඉතා දියුණු කේන්ද්‍රස්ථානයක් වන බැවින් එම කාර්යය සඳහාත් කුල්ල භාවිත කොට තිබීම අනුව පැහැදිලි වන්නේ එය අත්‍යවශ්‍ය මෙවලමක් වශයෙන් ඒ යුගයේ දී භාවිත වී ඇති ආකාරයයි. ක්‍රි. ව. 12 වන ශතවර්ෂයේදී පමණ මෙරට රාජ්‍යත්වයට පත්වූ පරාක්‍රමබාහු රජතුමාගේ දියණියක වශයෙන් සැලකෙන රත්නවල්ලි කුමරිය සම්බන්ධව ගෙතී පවතින පුරාවෘත්ත සමඟ ද කුල්ලෙහි සබඳතාවක් පවතී. රත්නවල්ලී කුමරිය මිනී මස් අනුභව කිරීමට දැඩි ලොල්භාවයක් දැක්වීම හා සම්බන්ධවූ සිද්ධියක් නිසා පරාක්‍රමබාහු රජතුමා විසින් ඇය රොඩී කුලයට පිටුවහල් කරනු ලැබූ බව ප්‍රකට ප්‍රවෘත්තියකි.

වටත් සදිසි බට කොල වියපු වල්ලියේ
මටත් බලන්නට සවුදම් ගැසුල්ලියේ
මෙරට ළඳුන් කුලු හරඹෙට හවුල්ලියේ
පැරකුම් රජුගේ දුව නව රත්නවල්ලියේ

(Siripala, 2006, p. 223) යන පද්‍යයෙන් පැවසෙන්නේ ද එම වෘතාන්තයයි.

කුල්ල කෘෂිකර්මාන්තය හා අත්‍යන්තයෙන් ම බද්ධ වූ මෙවලමකි. එමෙන් ම කාන්තාවන්ගේ ගෘහීය අවශ්‍යතා උදෙසා ද සෘජුවම දායක වන මෙවලමකි. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොරව අනාදිමත් කාලයක පටන් ශ්‍රී ලාංකිකයන් විසින් කුල්ල පරිහරණය කෙරුණ ද කුලු නිර්මාණය සම්බන්ධ විශේෂ ප්‍රාගුණ්‍යය පවතින්නේ රොඩී කුලයටය. රජු හෝ රදළ කෙනෙකු ප්‍රමුඛ කොට ඔවුන්ට සේවය කිරීමේ ප්‍රතිපත්තිය අනුව සිංහල කුල පිළිවෙළ සංවිධානය වූවේ ය. මුලදී කිසියම් ශිල්ප කර්මාන්තයක හෝ නිලයක යෙදෙමින් සමූහ වශයෙන් රැස්ව සිටි පිරිස ඒ කර්මාන්තයේ ශිල්පයේ හෝ නිලයේ නමින් හඳුන්වන ලදී (Wijesekara, 1955, p. 75 ). සාම්ප්‍රදායික සිංහල ගම ඒකකූලික විය. එනම්, එකම කුලයක අය එක ගමක ජීවත් වූහ. යමෙකුගේ පෙළපත් නාමය කුලය මඟින් පෙන්නුම් කෙරෙයි. ගම්පති බොහෝ විට කුලවත් පුද්ගලයෙකු වූයේ කුලයට හිමි නම්බුව හා ගරුත්වය සමාජ පාලනයට පහසුවක් වූ බැවිනි. එසේ ම ඉහළ කුලයේ ජන සංයුතිය ද පහළ කුලවලට වඩා ඉහළ මට්ටමක පවතී. ඉහළ කුලය නියෝජනය කළෝ ගොවීහු ය. ඔවුන් රට පාලනය, කෘෂි කර්මාන්තය සහ ගව පාලනය කළ ජනතාවයි. ජනගහනයෙන් වැඩි කොටසක් අයත් වූයේ ගොවි කුලයට යැයි සැලකේ. අනෙක් කුලවල කාර්යභාරය වූයේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරිම ය; සමාජ සංවිධානය විධිමත්ව පවත්වාගෙන යාමට අදාළ චාරිත්‍ර

ඉටුකිරීම ය. කුල සම්භවය පිළිබඳ අදහස් දක්වන එම්. ඩී. රාඝවන් රොඩී ජන කුලය බිහි වූයේ පරාක්‍රමබාහු රජුගේ දියණිය වූ රත්නවල්ලී කුමරිය මිනීමස් සැපයීමට දඩයක්කාරයාට කරන ලද අණ කිරීමට ලැබූ දඬුවම හේතුවෙන් බව සඳහන් කරයි (Ragawan, 2008, p. 03). මධ්‍යකාලීන ලංකාවේ ප්‍රධාන සමාජයීය විශේෂතාව වූයේ කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවූ ජනතාව අතර කිසියම් පරතරයක් ගොඩනැගී තිබීමය. මින් පළමු වැන්න ඒක රූපික පන්තියක් වූ අතර දෙවැන්න ව්‍යාපාරිකයන්, හස්තකර්මාන්තකරුවන්, ශිල්පීන් ආදී නානාවිධ කොටස්වලින් සමන්විත විය (Geiger, 2018, p. 44). මේ අනුව කුලු නිෂ්පාදනයෙහි යෙදුණු ශිල්පීන් අයත් ව ඇත්තේ ව්‍යාපාරිකයන්, හස්තකර්මාන්තකරුවන් හා ශිල්පීන් ඇතුළත් කෘෂිකාර්මික නොවූ ජන කණ්ඩායමට ය. මහනුවර යුගය වන තෙක් ම ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ විධිමත් ක්‍රමවේදය වූයේ එක්-එක් කුලයට නිශ්චිත වූ කාර්යභාරයක් වශයෙන් ඒවා සම්මතකොට තිබීමය. මෙම සම්මුතියට අනුව කුලු නිෂ්පාදනයෙහි නියැළුණු රොඩී ප්‍රජාව කුල ධූරාවලියෙහි පහළ ම ස්තරය නියෝජනය කර තිබෙනු හඳුනාගත හැකි ය (Ryan, 1953/2015, p. 144). ශ්‍රී ලාංකේය කුල සංයුතිය පිළිබඳව පර්යේෂණ සිදුකර තිබෙන දේශීය හා විදේශීය පර්යේෂකයෝ කිහිපදෙනෙක් වෙති. මේ පර්යේෂකයින් විසින් පෙළගස්වනු ලැබ තිබෙන ශ්‍රී ලාංකේය කුල ධූරාවලියෙහි පහළට වන්නට පවතින කුලවල ස්ථානගත කිරීමේ විෂමතාවක් පැවතීම විශේෂත්වයකි. පර්යේෂකයින් කිහිප දෙනෙකුගේ පෙළගැස්වීම්වලින් ඒ බව සනාථ කර ගත හැකිය. විජයතුංග (Wijayathunga, 1998, p. 14) දක්වන පරිදි පහත කුල වර්ග ලංකාවේ පවති. ඒනම් කරාවෝය, නවන්දන්නා අයය, හන්නාලි(ය), ඇම්බැට්ටයෝ(ය), බඩහැලයෝ(ය), දුරාවෝ(ය), රදවු(ය), හැලි(ය), හඟරම්මු(ය), වෙල්ලිදුරයි(ය), පන්නයෝ සහ හින්නයෝ(ය), හුනු දුරයි(ය), බත්ගම් පදුවෝ(ය), පල් හොරු (පදුවෝ), බත්ගම් බෙරවායෝ සහ ගහල බෙරවායෝ(ය), ඔලියෝ සහ පලියෝ(ය), කින්නරු(ය), රොඩියෝ(ය). නමුත් රැල්ෆ් පීරිස් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ශ්‍රී ලාංකේය කුල සංයුතිය මීට වඩා වෙනස් ස්වරූපයක් ගනී. එහි දී ද රොඩී කුලයට හිමිව ඇත්තේ අවසාන ස්ථානයයි. හන්දුරු (වර්ග දෙකයි. නම් කර නැත) ආචාරි (රන්කරුවෝ, කම්මල්කරුවෝ, වඩුවෝ, සිත්තරු), කුරුවේ ඇත්තෝ, ඇත් ගොවුවෝ (තත්ත්වයෙන් ආචාරි කුලයට සමානය), පනික්කියෝ (කරණවෑමියෝ), කුඹල්ලු (බඩහැලයෝ), රදවු (රෙදි අපුල්ලන්නෝ), හඟරම්මු (හකුරු, වහම්පුර), පදුවෝ, රෙදි වියන්නෝ (නැකැත්කාරයෝ, බෙරවායෝ හා නැට්ටුවෝ ද වූහ), කිඳියෝ (කුලු පොත්තෝ), කින්නරු, කදිම පැදුරු වියන්නෝ, රොඩියෝ" (Peiris, 2005, p. 204). රොඩී මිනිසුන් කොසු ඉදල් නිපදවීම, වේවැල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය, කොණ්ඩා හවරි තැනීම, ගව මළකුණු ඉවත් කිරීම, පාර ඇමදීම හා යන්ත්‍ර-මන්ත්‍ර ගුරුකම් ආදියෙහි නියැළුණු බව ප්‍රකටය. ඒ අනුව පෙනී යන්නේ කුල්ල පිළිබඳ සාහිත්‍යමය හා ජන විඥානමය සංකල්ප නිර්මාණය වී තිබුණ ද ඒ හා බැඳී පවතින සමාජ විද්‍යාත්මක පසුබිම පිළිබඳ සිදු වී ඇති පර්යේෂණ අල්ප බවය. සමාජ පරිවර්තනයන් සමඟ ම මේ මෙවලමෙහි වර්තමාන භාවිතය අවම මට්ටමක පවතින බැවින් තිරසර සංවර්ධන කාර්යය උදෙසා එහි උපයෝගිත්වය සම්බන්ධයෙන් කාලෝචිත පියවර ගැනීම වැදගත් ය.

## අරමුණු

කුල්ල සිංහල ජන ජීවිතයේ විවිධ කටයුතුවල දී ජීවන වෘත්තීන්වල භාවිත මෙවලමක් වුව ද, වර්තමාන යුගය වන විට අභාවයට යමින් පවතින්නකි. සිංහල සංස්කෘතියට අයත් මෙබඳු තිරසර හා පරිසර හිතකාමී අංග අනාගත පරපුර සඳහා ආරක්ෂා කිරීම වර්තමාන සමාජ වගකීමකි. ඒ අනුව කුල්ල කේන්ද්‍රීය සමාජ හා සංස්කෘතික පදනම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණය. සමාජීය අංගයන් හා විවිධ අභිචාර විධි ආශ්‍රිතව ගොඩනැගී ඇති කුල්ල පිළිබඳ වර්තමාන ලාංකේය ප්‍රජාවගේ ආකල්ප අධ්‍යයනය කිරීම හා අනාගත පරපුර සාම්ප්‍රදායික සංස්කෘතික අංග පිළිබඳ දැනුවත් කිරීමට යෝග්‍ය ක්‍රියා මාර්ග ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමත් අධ්‍යයනයේ සෙසු අරමුණු ලෙස හැඳින්විය හැකි ය.

## න්‍යායාත්මක විග්‍රහය සහ පර්යේෂණ ක්‍රමවේදය

න්‍යායාත්මක විග්‍රහයේ දී අභෞතික සංස්කෘතිය හා බද්ධ වූ සම්මුතීන් වන භාෂාව සහ චාරිත්‍ර වාරිත්‍ර සමාජගත කිරීම, අස්පෘශ්‍ය උරුමය, ස්වාභාවික අනුවර්තනයට ඉඩ දීම සහ ගෝලීයකරණය හේතුවෙන් සිදුවන සංස්කෘතිකාංග වඳ වී යාම හමුවේ පවතින අභියෝග සැලකිල්ලට ගැනිණි. ආගමික විශ්වාසයන්, චින්තන රටා සහ සංස්කෘතික අනන්‍යතාව, ආධ්‍යාත්මික භාවිතයන්, වාර්ගික බැඳීම් සහ සදාචාරාත්මක රාමු, සම්මතයන් සහ වටිනාකම් පිළිබද සංකල්ප සහ විචල්‍ය අධ්‍යයනයට පාදක කරගෙන තිබේ. ඒ අනුව විසරණවාදය (Diffusion) සහ ගෝලීයකරණය න්‍යායාත්මක පදනම ලෙස යොදා ගන්නා ලදී. සංස්කෘතීන් අතර අදහස් හෝ භාවිතයන් පැතිරීමට හේතු වන ගුණාංග වෙනස් වීම හඳුනාගැනීම විසරණවාදයෙන්ද සමජාතීයකරණය හෝ දෙමුහුන්කරණය මෙහෙයවන අන්තර් සම්බන්ධිත ආර්ථික හා සමාජීය බලවේග ඉස්මතු කිරීම ගෝලීයකරණයෙන් ද ආවරණය කර ඇත.

ගුණාත්මක පර්යේෂණවල සද්භාවවේදය (Ontology) වන්නේ ආත්මීයවාදයයි (Subjectivism). දැනුම ගවේෂණය කරන මාර්ගය (Epistemology) වන්නේ අර්ථ නිරූපණමය ප්‍රවේශයයි. සුසමාදර්ශ (Paradigms) පිළිබඳ සැලකීමේ දී සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදය සහ ප්‍රපංචවේදය භාවිත වෙයි. සමාජ ජීවිතය කේතකරණය කර විශ්ලේෂණය කරමින් අනාවරණය කිරීමේ ක්‍රමානුකූල සද්භාවවේදය ලෙස යොදාගනු ලැබුවේ නිර්මාණවාදයයි. එනම්, මෙම ප්‍රවේශයට අනුව සියල්ල මිනිසා විසින් නිර්මාණය කරනු ලැබෙයි. අදාළ නියැදිය තෝරා ගැනුණේ සාධක තුනක් පදනම් කරගෙන ය. කුලු නිෂ්පාදනය සඳහා භාවිත කෙරෙන ප්‍රධාන අමුද්‍රව්‍ය වන වේවැල් ශාකයට ප්‍රසිද්ධ ගම්පහ දිස්ත්‍රික්කයේ රදාවඩුන්න හා වේවැල්දෙණිය ග්‍රාම ද, ප්‍රායෝගික කාර්යයන් සඳහා කුලු භාවිතය ඉහළ සංඛ්‍යාත්මක අගයක පවතින කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව සහ ඉහළගම ග්‍රාම ද, සාම්ප්‍රදායික ව කුලු නිෂ්පාදනය ජීවන වෘත්තිය කර ගැනුණු කුල ගම්මාන දෙකක් වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනාව සහ ලෝකුරුගම යන ග්‍රාම ද නියැදිය වශයෙන් තෝරා ගැනුණේ ඒ අනුව ය.

වගු අංක 1 අනුව කුලු නිෂ්පාදනය හා අමුද්‍රව්‍ය සැකසීම පාරම්පරිකව සිදුකරන ගම්පහ දිස්ත්‍රික්කයේ රදාවඩුන්න සහ වේවැල්දෙණිය යන ගම්වල වසර විස්සකට වඩා එම කර්මාන්තයේ නියුතු පවුල් අතරින් පුද්ගලයින් හය දෙනෙකු

**වගු අංක 1**


අධ්‍යයන නියැදිය

| සාධකය | තෝරාගත් දිස්ත්‍රික්ක | තොරාගත් ග්‍රාමයන් | නියැදි ප්‍රමාණය |
|---|---|---|---|
| කුලු නිෂ්පාදනය හා අමුද්‍රව්‍ය සැකසීම | ගම්පහ | රදාවඩුන්න | 2 |
| | | වේවැල්දෙණිය | 4 |
| කුලු භාවිතය බහුල ප්‍රදේශ | කුරුණෑගල | මහව | 3 |
| | | ඉහළගම | 4 |
| කුලු නිෂ්පාදනය කරන කුල සහිත ගම්මාන | කුරුණෑගල | හක්වටුනාව | 3 |
| | | ලෝකුරුගම | 4 |
| | | එකතුව | 20 |

සටහන. උක්ත ප්‍රදේශ තෝරා ගැනීමේ දී පූර්ව සොයා බැලීමක් සිදු කර ඉන් අනතුරුව නියැදිය තෝරා ගන්නා ලදී.

**රූප සටහන 1**

නියැදියට යොදාගත් අයගේ ස්ත්‍රී පුරුෂභාවය




සටහන. කුලු භාවිතය බහුලව සිදුවන්නේ කාන්තාවන් අතින් බැවින් හා ගෘහීය කර්මාන්ත වශයෙන් ද වැඩි දායකත්වයක් කාන්තාවන් විසින් දරනු ලැබීම යන කරුණු පදනම් ව පූර්වෝක්ත නියැදිය සකස් කර ගැනිණි.

සම්මුඛ සාකච්ඡා සඳහා යොදා ගන්නා ලදී. ගොවිතැන් හා වෙනත් කටයුතු, විවිධ පූජාකර්ම හා චාරිත්‍ර සඳහා කුල්ල බහුලව භාවිත කරන කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ආසන්න කාලය තුළ එලෙස කුල්ල භාවිතයට ගැනුණු හා නිවසේ අවම වශයෙන් කුලු තුනකට වඩා තිබෙන පවුල්වල ගෘහමූලිකයන් අතරින් හත්දෙනෙකු තෝරා ගන්නා ලදී. කුලු නිෂ්පාදනය කරන කුල සහිත ගම්මාන අතරින් පුද්ගලයින් හත්දෙනෙකු තෝරා ගන්නා ලදී. නියැදියට අදාළ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 60% ස්ත්‍රීන් වූ අතර 40% පුරුෂයින් වූහ (රූප සටහන 1).

පර්යේෂණයට දත්ත සැපයීමෙන් දායක වූ ප්‍රතිචාරකයන්ගේ වයස් කාණ්ඩ ද නිරීක්ෂණයට පාත්‍ර විය (වගු අංක 2). ඒ අනුව සමස්ත ප්‍රතිචාරකයන්ගෙන් 30%ක් පමණ අවුරුදු 61-65 අතර වයස් කාණ්ඩය ද 25%ක් පමණ අවුරුදු 65ට වැඩි වයස් කාණ්ඩය ද, 20%ක් පමණ අවුරුදු 56-60ත් වයස් කාණ්ඩය ද 15%ක් පමණ අවුරුදු 51-55 වයස් කාණ්ඩය ද 10%ක් පමණ අවුරුදු 45-50 වයස් කාණ්ඩය ද නියෝජනය කරන බව නිරීක්ෂණය විය. මේ ගම්මානවල වාසය කළ තරුණ ප්‍රජාව අතර කුල්ලෙහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ සැලකිය යුතු

**වගු අංක 2**

ප්‍රතිචාරකයන්ගේ වයස් කාණ්ඩ

| වයස් කාණ්ඩය | ප්‍රතිචාර ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 45-50 | 2 | 10% |
| 51-55 | 3 | 15% |
| 56-60 | 4 | 20% |
| 61-65 | 6 | 30% |
| 65 වැඩි | 5 | 25% |
| එකතුව | 20 | 100% |

**වගු අංක 3**

තේමාත්මක විශ්ලේෂණය සඳහා කේත තේමාවන් බවට පත් කිරීම

| කේත | තේමාව |
|---|---|
| කුලුවර්ග | තේමා අංක 1: කුලු විවිධාංගිකරණය |
| අමුද්‍රව්‍ය සකස් කරගැනීම | තේමා අංක 2: කුලු නිෂ්පාදනය |
| සායම් පෙවීම | |
| කුලු විවීම | |
| කුල්ල සඳහා භාවිත රටා වර්ග | |
| බෙලි ලාටු භාවිතය | තේමා අංක 3: කුලු සංරක්ෂණ ක්‍රමෝපායයන් |
| තිඹිරි ලාටු භාවිතය | |
| ගොම භාවිතය | |
| කොහොල්ලෑ භාවිතය | |
| කුල්ල හා සමාජ හැසිරීම | තේමා අංක 4: කුල්ල භාවිතය |
| ශාන්තිකර්ම හා කුල්ල | |
| කුල්ල හා බැඳි සංකේත | |
| ප්‍රස්තාව පිරුළු | තේමා අංක 5: කුල්ල හා තදනුබද්ධ භාෂාත්මක ප්‍රවේශය සහ එහි පවතින ජනශ්‍රැති විද්‍යාත්මක වටිනාකම |
| ජන කවි | |

සටහන. පර්යේෂිකාවන් විසින් සකස් කරන ලදී, 2024

නැඹුරුවක් නොපවතින බව ද පූර්වෝක්ත නිරීක්ෂණවලින් අනාවරණය විය.

දත්ත විශ්ලේෂණයේ දී තේමාගත විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගැනිණි. එහි දී කේතනය කිරීම, තේමාවන් ජනනය කිරීම, සමාලෝචනය කිරීම, නිර්වචනය කිරීම හා නම් කිරීම මෙන් ම සමස්ත පර්යේෂණ අනාවරණයන් ක්‍රමානුකූල ව, විද්‍යාත්මක ව හා සහසම්බන්ධතාවකින් යුක්ත ව ඉදිරිපත් කිරීම කෙරෙහි ප්‍රමුඛාවධානයක් යොමු කෙරිණි. තේමායෝජනයේ පැහැදිලි බව හා සංක්ෂිප්තභාවය ආරක්ෂා කර ගැනීම වස් උද්ගාමී සහ නිගාමී තර්කන ප්‍රවේශය භාවිත කෙරුණු අතර දත්තවල සාරය සියුම් ව ග්‍රහණය කර ගැනීමට ද එමගින් සැලකිය යුතු පිටුබලයක් සැපයිණි. පර්යේෂණය සඳහා භාවිත තේමා කේත ඉහත වගු අංක 3 යටතේ නිරූපණය වේ.

## සොයාගැනීම් සහ සාකච්ඡාව

සාමාන්‍ය ජනතාව විසින් ස්වකීය දෛනික ඕනෑ-එපාකම් සපුරා ගැනීම් වස් නිර්මාණය කර ගැනුණු කුල්ල, හුදු භාණ්ඩයක් හෝ මෙවලමක් පමණක් නොවේ; එය ලංකාවේ

සංස්කෘතික දර්ශකයකි. මෙරට භාණ්ඩ හා සේවා හුවමාරු අර්ථ ක්‍රමය ක්‍රියාත්මක වූ සමයේ එමඟින් ආර්ථික දේහය ද ශක්තිමත් කෙරිණි. ලාංකේය සමාජ සංදර්භය ඇතුළත අධස්ථ ව්‍යුහයේ සිට උපරි ව්‍යුහය දක්වා නිර්බාධක ව ගමන් කිරීමේ සුවිශේෂ හැකියාවක් ද මේ මෙවලම සතුව තිබිණ. කුල්ල නිර්මාණය කර ගැනීමේ සිට තදනුබද්ධ භෞතික හා අභෞතික භාවිතය දක්වා වන සංකීර්ණ එළඹුම් විශ්ලේෂණය කර බැලීමේ දී වර්තමාන ගෝලීය වාණිජ සමාජ සංදර්භය ඇතුළත ඉහළ ආර්ථික වටිනාකමක් උත්පාදනය කිරීමේ විභවතාවක් එය සතුව පවතින බව හඳුනාගත හැකි ය. ප්ලාස්ටික් ඇතුළු දිරාපත් නොවන අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදිත භාණ්ඩ, උපකරණ හා මෙවලම් සමඟ සංසන්දනය කිරීමේ දී ඉහළ පරිසර හිතකාමී සැකැස්මක් සහිත මේ මෙවලම රටක තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම් වස් බෙහෙවින් ම ඵලදායක වන්නේය. කුලුවර්ගවල හැඩතල, ඒවා වර්ණ ගැන්වීම හා දීර්ඝකාලීන ව භාවිතයේ පවත්වා ගැනීම සඳහා භාවිත ක්‍රමෝපායයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සාම්ප්‍රදායික සිංහලයන් සතුව පැවති ඉහළ තාක්ෂණයත් කලාත්මක පරිකල්පනයත් කෙබඳුදැයි වටහා ගැනීමට ද හැකියාව ලැබේ. මානවහිතවාදී සංකල්ප කේන්ද්‍රීය ප්‍රවේශයක දී ඇතැම් දුර්වලතාවලින් සමන්විත වන්නේ යයි හඳුනාගෙන තිබුණ ද ලංකාවාසීන්ගේ අනන්‍යතාව රඳා පැවතියේ කුල ධූරාවලිය හා තදනුබද්ධ සමාජ ස්තරායනය තුළය. මෙකී කුල ස්තරායන සංකල්පයට ව්‍යුහාත්මක ශක්තියක් මෙන් ම කලාත්මක හා ආර්ථික වටිනාකමක් ද කුල්ල හා බැඳුණු සංකීර්ණ ක්‍රියාදාමය මඟින් දායාද කෙරිණි. නවීකරණය, නාගරීකරණය, ගෝලීයකරණය, වණික් සංස්කෘතිය හා අනපේක්ෂිත කාලගුණික විපර්යස්තතා හමුවේ මෙකී මෙවලමෙහි පැවැත්ම අභියෝගයට ලක් ව ඇත. මේ පර්යේෂණයේ සාකච්ඡාව හා නිරීක්ෂණ මඟින් ආමන්ත්‍රණය කෙරෙන්නේ තත් අභියෝගාත්මක එළඹුම්වලට ය. ඒ අනුව සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය හා පර්යේෂණ ක්ෂේත්‍රයෙන් ලබා ගැනුණු දත්ත විශ්ලේෂණය කිරීමෙන් වගු අංක 3 හි දැක්වෙන පරිදි තේමා පහක් යටතේ දත්ත විශ්ලේෂණය සිදු කෙරේ. ඒ අනුව කුලු විවිධාංගිකරණය, ගෘහීය හා කෘෂිකාර්මික මෙවලමක් ලෙස එහි භාවිතය, කුලු සංරක්ෂණ ක්‍රමෝපායයන්, කුල්ල හා තදනුබද්ධ අභෞතික සංස්කෘතිකාංග සහ එහි පවතින ජනශ්‍රැති විද්‍යාත්මක වටිනාකම යන තේමා යටතේ මේ පර්යේෂණයෙහි ව්‍යුහය සකස් කෙරිණි.

### කුලු විවිධාංගිකරණය

අතීත ශ්‍රී ලාංකිකයන් අතර භාවිතයේ පැවති කුලු වර්ග ගණනාවක් වූ බව පැවසේ; බොකු කුල්ල (කමත් කුල්ල), ගමේ කුල්ල, බට කුල්ල, වේවැල් කුල්ල, ඔරු කුල්ල, යාපනේ කුල්ල, පන් කුල්ල, සායම් කුල්ල, හණ කුල්ල, උණ කොළ කුල්ල, තල් කොළ කුල්ල සහ මල් කුල්ල (සෙල්ලම් කුල්ල, ළමා කුල්ල) යනු ඉන් කිහිපයකි (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). බොකු කුල්ල කෘෂිකාර්මික කටයුතුවල දී "කමත් කුල්ල" නමින් ද හැඳින්වේ. එහි ස්වරූපය වන්නේ ඉදිරිපස පළලින් වැඩිවන ආකාරයටත් පසුපස බොකුටු ආකාරයටත් නිර්මාණය කොට තිබීමයි. මෙය සාමාන්‍යයෙන් භාවිත කෙරෙන්නේ බැත සකසා ගැනීම සඳහා ය. ඒ අනුව එය කමත් කුල්ල යන විශේෂිත නාමයෙන් ද හැඳින්වේ. ගොවි ගෙදර විශේෂිත කුලු වර්ග දෙකක් භාවිතයට ගනු ලැබේ. එකක් කමත් කුල්ල ය. ඒ කමතේ කටයුතු වෙනුවෙනි. කමත් කුල්ල ගොවි ගෙදර කටයුතු උදෙසා භාවිතයට නොගනී. එම නිසා කමත් කුලු තිබෙන ප්‍රමාණය වෙනම බිත්තියේ එල්ලා තිබෙයි. ඊට කමත් කුලු ආන කියා බැවහැර කෙරේ (Dalupotha, 2002, p. 22). ගෘහීය අවශ්‍යතා විෂයෙහි බහුලව යොදා ගැනෙන්නේ ගමේ කුල්ල ය. එය, හාල් කුල්ල, පාහින කුල්ල යන නම්වලින් ද ගැමියෝ හඳුන්වති. "ගොවි ගෙදර නිතර භාවිතයට ගනු ලබන්නේ හාල් කුල්ල ය. හාල් පෙළීමට, කුරහං, මුං ආදිය පෙළීමට හාල් කුල්ල උපයෝගී කර ගැනේ. ඒවා වෙන ම කුලු ආනක රඳවා තබයි" (Dalupotha, 2002, p. 22). වර්තමානයේ දියුණු තාක්ෂණික ක්‍රමෝපායයන් භාවිතයෙන් සහල්වල පවතින ගල්, වැලි හා දහයියා ඉවත් කෙරුණ ද අතීතයේ වංගෙඩිය හා මෝල්ගස භාවිතයෙන් සහල් සකසාගත් ගෘහිණියන්ට ඒවායේ දහයියා ඉවත් කර ගැනීම සඳහා කුල්ල අනිවාර්යයෙන් ම භාවිත කිරීමට සිදුවිණි. කුල්ල හා බැඳුණු මුඛ්‍යතම ගෘහීය අවශ්‍යතාව මෙය වූ හෙයින් එය හාල් කුල්ල යන විශේෂිත නාමයෙන් ව්‍යවහාරයට පැමිණ තිබේ. මිරිස් හා ධාන්‍ය වියළීම, පලාවර්ග හා වෙනත් ද්‍රව්‍ය වර්ග බහාලීම යනාදී ගෘහාශ්‍රිත කටයුතු සඳහා ද ගමේකුල්ල යොදා ගැනේ. මෙය කමතේ කටයුතු සඳහා භාවිතයට නොගැනීම විශේෂත්වයකි.

බටපතුරු අමුද්‍රව්‍ය ලෙස යොදාගෙන නිර්මාණය කෙරෙන කුල්ල බටකුල්ල ලෙස ව්‍යවහාරයට පැමිණ තිබේ. සවි ශක්තිය අතින් අනෙක් අමුද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණය කෙරෙන කුලුවලට වඩා ඉහළ මට්ටමක පවතින මෙම කුලු විශේෂය කෘෂිකාර්මික හා ගෘහීය කටයුතු ද්වයෙහි දී ම භාවිතයට ගැනේ. වේවැල් නමැති ශාකයෙන් සකස් කර ගනු ලබන ඉතා ශක්තිමත් මෙන් ම ප්‍රකට ම කුලු වර්ගය වේවැල් කුලු වේ. එහි ඇති සවි ශක්තිය නිසා ම කමතේ කාර්යයන්ට බහුලව යොදා ගැනේ. වර්තමානයේ පවා කුලු නිෂ්පාදනය සඳහා බහුලව භාවිතයට ගැනෙන්නේ වේවැල් නිසා වේවැල් කුලු සුලබව භාවිතයට පැමිණ තිබෙනු දැකිය හැකි ය. ඔරු කුල්ල එනමින් හැඳින්වෙන්නේ එහි ආකෘතික හැඩගැස්ම පදනම් කරගෙන ය. "ඔරු කුල්ල දිගින් වැඩි ය. ඉදිරිපස පළලින් ද වැඩි අතර පිටු පස පළල අඩුය" (Gunasoma, 2002, p. 29). පූර්වෝක්ත විග්‍රහය අනුව දිග හා පළල අතින් ද එය අනෙක් කුලුවලට වඩා වෙනස් ස්වරූපයක් ගන්නා බව පැහැදිලිවේ. ඔරුවක හැඩයට, දිගින් වැඩිවන ආකාරයට නිමවා තිබීම මෙහි පවතින විශේෂත්වය වන අතර වර්තමානයේ මෙම කුලු විශේෂය භාවිතයේ නොමැති තරම් ය. යාපනේ කුල්ල බොහෝ විට දෙමළ ජනතාවට ආවේණික වූවකි. ඉදිරිපස හා පිටුපස එක සමාන පළලකින් යුක්තව නිමවා තිබීම මෙහි පවතින විශේෂත්වයකි. පොල් අත්තක ආකාරයට එකම පැත්තකට විහිදී යන අයුරින් නිමවා විචිත්‍ර ආකාරයෙන් වර්ණ ගන්වා තිබීම නිසා මෙම කුලු වර්ගය අනෙක් කුලුවලට වඩා විචිත්‍ර ස්වභාවයක් ගනී. පන් ශාකය සාමාන්‍යයෙන් භාවිත කෙරෙන්නේ පැදුරු, මාගල්, වට්ටි, පෙට්ටි හා මලු ආදිය සකසා ගැනීම සඳහා ය. තරමක රළු ස්වරූපයකින් යුක්ත පන් විශේෂයක් වන තුන්හිරියා පන්වර්ගය ගස පිටින් ම අව්වේ වියළාගෙන එය භාවිතයෙන් නිර්මාණය කර ගැනෙන කුලු විශේෂය පන්කුල්ල යන නාමයෙන් හැඳින්වීමට සිංහලයෝ පුරුදුව සිටිති. සායම් කුල්ල නමින් හැඳින්වෙන්නේ යොදා ගැනෙන අමුව්‍යවලට බහුලව සායම් ගල්වා සකසා ගෙන ඇති හෙයිනි. හණ කුලු යන නාමය භාවිත කෙරෙන්නේ හණ ශාකයේ කොළ භාවිත කරමින් සකසා ගැනෙන කුලුවලටය.

කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත නොකෙරෙන, ගෘහීය අවශ්‍යතා උදෙසා අතීතයේ භාවිත කෙරුණු මේ කුලු වර්ගය වර්තමානයේ නිෂ්පාදනය නොකෙරෙන බව අදාළ ශිල්පීන් සමඟ සිදු කළ සාකච්ඡාවලින් අනාවරණය විය. උණ ශාකයේ කොළ භාවිතයෙන් නිර්මාණය කර ගැනෙන්නේ උණ කුල්ල ය. මුළුතැන්ගෙයි කටයුතු සඳහා අතීතයේ දී යොදාගෙන තිබෙන මෙම කුලු විශේෂය ද වර්තමාන භාවිතයේ නොමැත. තල් ශාකයේ කොළ ඉරා, වියළාගෙන ඒවා භාවිතයෙන් සකසා ගැනෙන කුල්ල තල් කොළ කුල්ල නම් වේ. යාපනය ප්‍රදේශයේ මෙම ශාක විශේෂය බහුලව වැවෙන බැවින් ඒ ප්‍රදේශයේ ජනතාව අතර මෙම කුලු නිෂ්පාදනය මෙන් ම භාවිතය ද බහුල ව සිදුවනු පෙනේ.

අතීතයේ දී මෙරට වාසය කර ඇති ශිල්පීන් විසින් විවිධ ශාකවල පත්‍ර භාවිතයෙන් කුලු නිෂ්පාදනය කරනු ලැබ ඇති ආකාරය "මං දන්න හැටියට දෙල් කොළවලින් හදපු, ඒ කියන්නේ දෙල් කොළ අහුරලා ගැටිය බැඳලා තියන පරණම කුල්ල නුවර කටුගෙයි තියනවා. ඒක හරි විශාලෙට වියලා තියනවා" (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016) යන්නෙන් සාම්ප්‍රදායික ශිල්පියකු විසින් සිදුකෙරුණු අනාවරණයෙන් පැහැදිලි වේ. "මල් කුල්ල, සෙල්ලම් කුල්ල, ළමා කුල්ල" ලෙස හඳුන්වනු ලබන්නේ නැටුම් සඳහා භාවිත කරනු ලබන කුලු විශේෂයයි. මෙම කුල්ල අනෙක් කුලුවලට වඩා ප්‍රමාණයෙන් කුඩා ය; බොකු ස්වරූපයෙන් ද අඩුය. පැරණි සිංහලයින් ඇසුරේ පැවති සියලු ම හස්ත කර්මාන්ත කේන්ද්‍රීයව පුළුල් සංස්කෘතිකාංග ගණනාවක් නිර්මාණය වී තිබේ. කුල්ල ආශ්‍රිතව ද එබඳු සංස්කෘතිකාංග ගණනාවක් බිහිවී තිබේ. කුලු නැටුම ඉන් එකකි. මුල දී සියලු ම කාර්යයන් සඳහා පොදුවේ භාවිත කෙරුණු කුල්ල, නැටුම සඳහා ද භාවිත කෙරෙන්නට ඇත. කුල්ල නිර්මාණයෙහි යෙදුණු ශිල්පීන්ගේ කලාත්මක පරිකල්පනයත් තාක්ෂණයත් ක්‍රමක්‍රමයෙන් වැඩිදියුණු වත් ම එක් එක් අවශ්‍යතා උදෙසා වෙන් වෙන් වූ කුලු නිෂ්පාදනය කෙරෙන්නට ඇත. මල් කුල්ල ද එබන්දකි. මෙය භාවිත කරන්නෝ කාන්තාවෝය; විචිත්‍ර වර්ණ සහිත රටා යෙදූ මේ සෙල්ලම් කුල්ල භාවිතයෙන් ඔවුහු සුන්දර නර්තනයක නියැලුණහ. මෙය, ප්‍රමාණයෙන් කුඩාවටත් සැහැල්ලුවටත් නිර්මාණය කර ඇත්තේ නර්තනයේ දී සිදුවන ශරීර චලනයට ඔරොත්තු දෙන පරිදි ය.

## කුලු නිෂ්පාදනය

පාරම්පරිකව රොඩී කුලයට නිශ්චිතව පැවරී තිබුණු ජීවනෝපාය වූ කුලු කර්මාන්තය සම්පූර්ණයෙන් ම ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතයෙන් සිදුකෙරුණු ගෘහස්ථ කර්මාන්තයකි. මේ සඳහා අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගැනුණේ වේවැල්, බටපතුරු, ඉඳිපතුරු, කිරිවැල්, තල්කොළ යනාදියයි. බටපතුරු සමානව කපා ගැනීම සඳහා භාවිත කෙරුණු උපකරණය වූයේ ගිරයයි (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). මීට අමතරව පන්, හණ, උණකොළ යනාදිය ද කුලු නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇති බව පන්කුල්ල, හණකුල්ල, උණකොළ කුල්ල යනාදි නම්වලින් හැඳින්වෙන කුලු වර්ග පැවතීම අනුව පැහැදිලිවේ. මෙකී අමුද්‍රව්‍ය පළාතෙන් පළාතට වෙනස් ස්වරූප ගන්නා බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ආසනයේ රත්නදිවුල්වැව, ලෝකුරුගම සහ හක්වටුනාව යන ගම්මානවල සහ බස්නාහිර පළාතේ වේවැල්දෙණිය, රදාවඩුන්න ප්‍රදේශයේ පාරම්පරික කුලු නිර්මාණ ශිල්පීන් සමඟ සිදුකෙරුණු සාකච්ජාවල දී අනාවරණය විය. සමස්තයක් වශයෙන් බලන කල කුලු නිෂ්පාදනය සඳහා බහුලව යොදාගැනෙන අමුද්‍රව්‍යය වන්නේ වේවැල් ය. කුලු නිෂ්පාදනය සඳහා පමණක් නොව "කූඩා සෑදීමට ද ඇඳ වියල් විවීමට ද", (Coomaraswamy, 1962, p. 243) වේවැල් යොදාගත් බවට සාක්ෂ්‍ය පවතී.

## අමුද්‍රව්‍ය සකස් කරගැනීම

කුල්ල නිර්මාණය කිරීමේ මූලික අදියර වන්නේ ඒ සඳහා භාවිත කෙරෙන පූර්වෝක්ත අමුද්‍රව්‍ය නිසි පදමට සකස්කර ගැනීම ය. එහි දී යොදාගැනෙන අමු ද්‍රව්‍ය නම්‍යශීලීවීමත් නොකැඩෙන සුළුවීමත් අත්‍යවශ්‍ය විය. වේවැල්, ඉඳිපතුරු, බටපතුරු යනාදිය ජලයේ පොඟවා වියළා රළු බවින් තොරව සකස් කර ගැනෙන්නේ එකී නම්‍යශීලීභාවය ඇතිකර ගැනීමට ය. පන්, හණ, උණකොළ, තල්කොළ යනාදිය වියළා ගැනීම අනිවාර්යය වූයේ ඒවායෙහි පවතින තෙත ගතිය ඉවත්කර ගැනීමට ය. තෙත සහිත අමුද්‍රව්‍යවලින් කුලු විවීම සිදු කළ හොත් වියළුණු විට කුල්ලේ බැමි බුරුල් වී, රටා අතුරින් සිදුරු මතු වී කුල්ල භාවිත කළ නොහැකි තත්ත්වයට පත්වේ. ඒ අනුව මෙකී අමුද්‍රව්‍ය සකස් කර ගැනීම කුල්ල ඇතුළු අවශේෂ භාණ්ඩවල කල්පැවැත්ම කෙරෙහි අවධානයෙන් සිදුවී ඇති බව පැහැදිලිවේ.

## සායම් පෙවීම

කුලු නිර්මාණය කර ගැනීමේ දී ඒ සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍යවලට සායම් පෙවීමේ ක්‍රියාවලිය මේ ශිල්පීන් සතුවූ සාම්ප්‍රදායික දැනුම පිළිබඳ අවබෝධ කරගැනීමෙහිලා අතිශය වැදගත් ය. බොහෝවිට සිංහලයින් විසින් භාවිත කරනු ලැබ ඇත්තේ සායම් රහිත කුලු වුවත් ඇතැම් විශේෂිත අවස්ථාවල දී වර්ණවත් කුලු ද භාවිතයට ගෙන තිබේ. මෙය, කුලු නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සකස් කිරීම සම්බන්ධ සංකීර්ණ ස්වභාවයක් දරන ක්‍රියාවලියකි. "පැදුරු සහ පන් ආශ්‍රිත භාණ්ඩ නිපදවීමට පන් සකස් කිරීමේදී හමුවන ඉතා සංකීර්ණ ක්‍රියාදාමය වශයෙන් පන්වලට සායම් දැමීම හැඳින්විය හැකිය" (Ihalagama, 1997, p. 57). කුලු කර්මාන්තයේ මෙන් ම පන් කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් ද මේ සඳහා භාවිතකොට තිබෙන්නේ ස්වාභාවික අමුද්‍රව්‍ය වීම මේ කර්මාන්ත ද්වයය අතර පවතින සාම්‍යයක් වශයෙන්ද ගිණිය හැකි ය. කුලුවලට මෙන් ම පන්වලට ද අවශ්‍ය රක්ත වර්ණය සකසාගෙන ඇත්තේ පතඟි නමැති ශාකයේ අරටුව සිහින් කැබලිවලට කපා මැටි මුට්ටියක දමා තම්බාගත් වතුරෙහි අදාළ අමුද්‍රව්‍ය බහා පොඟවා ගැනීමෙනි. කහට නම් ශාකයේ මුල්, කොළ, පොතු, ගෙඩි, මල් යන පස්පංගුව තම්බාගත් වතුරට කුල්ල විවීමට යොදා ගැනෙන අමුද්‍රව්‍ය දමා පොඟවා, වියළා ගැනීම ද වර්ණ ගැන්වීමේ දී භාවිත කර තිබෙන තවත් ක්‍රමවේදයකි (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). කුලු සඳහා බහුලව යොදාගෙන තිබෙන්නේ කොළ, නිල් සහ රතු යන වර්ණ ය (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). සහල් පෙළීම, පලාවර්ග බහාලීම වැනි ගෘහීය ආහාර සකස් කිරීමේ ක්‍රියාවලිය හා කුල්ල ඍජුව ම දායක වී ඇති බැවින් ස්වාභාවික අමුද්‍රව්‍ය යොදාගෙන ඒවා සකස් කර ගැනීමෙන් ශරීර ස්වස්ථතාව කෙරෙහි පිටුබලයක් සැපයෙන පරිසරය හා තදනුබද්ධ ශාක ප්‍රජාව පිළිබඳ ව තත් ශිල්පීන් සතුව පැවති දැනුම අනාවරණය වේ.

### කුලු විවීම

කුල්ල විවීමේ දී භාවිත කර තිබෙන ක්‍රමවේදය සාම්ප්‍රදායික සිංහලයින් සතුව පැවති සියුම් තාක්ෂණය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ප්‍රායෝගික මූලාශ්‍රයයකි. සාමාන්‍යයෙන් පැදුරක් විවීම ආරම්භ කෙරෙන්නේ එහි මුල සිට ය. එහෙත් කුල්ල විවීම ආරම්භ කෙරෙන්නේ මුල සිට නොව එහි මධ්‍යයේ සිට ය. එහිදී පතුරු හෝ පන්කොළ, තල්කොළ වැනි අදාළ අමුද්‍රව්‍ය කිසියම් රටාවකට තබමින්, එකක් තව එකක් අතර හිර කරමින් ඉතා තදින් විවීම සිදු කෙරේ. තදින් විවීම සිදු නොවුණ හොත් හිඩැස් හටගැනීමෙන් එහි පවතින සමබරතාව ගිලිහීම සිදුවේ. සාමාන්‍යයෙන් කුල්ලක ඉදිරිපස පළලින් වැඩිය. පසුපසට යන විට ක්‍රමක්‍රමයෙන් පළලින් අඩුවී අවසානයේ දී පිටුපසට නෙරූ ගැටිති දෙකක් සහිතව එය නිමකෙරේ. සාම්ප්‍රදායික සිංහලයින් විසින් කුල්ල එබඳු හැඩයකින් නිර්මාණය කරනු ලැබ ඇත්තේ කෘෂිකාර්මික කටයුතුවලට පහසුවන පරිදි ය. කුල්ලේ අග කොටස බොකු ස්වරූපයක් ගන්නා බැවින් බැත විශාල ප්‍රමාණයක් එයට පුරවාගත හැකි ය. එහි පහළ කොටස පළලින් වැඩි නිසා බැත හුළං කිරීමේ දී නිසි පරිදි වී පහළට ගලාගෙන ඒම සිදුවේ. වී ගොඩගැසීමෙන් අනතුරුව එහි ඇති කාටු ඉවත් කරගැනීම සඳහා එයට කුල්ලෙන් පවන් ගැසීම සිදුකෙරේ. ඒ කාර්යය සඳහා ද කුල්ලේ පවතින මේ බොකු හැඩය මගින් මනා පිටුබලයක් සැපයේ. එනම්, කුල්ලේ බොකු පැත්තෙන් අල්ලා පවන් ගැසීමේ දී එහි පහළට වන්නට පළල හැඩයක් ඇති නිසා හුළං පහර ඉතා සැරට වැදී ඉතා පහසුවෙන් කාටු ඉවත්වීම ය.

කුල්ල විවීමේ දී ශිල්පීන් මුහුණපෑ බරපතළම අභියෝගය වූයේ එහි ගැටිය නිර්මාණය කිරීම ය. මේ සඳහා නම්‍යශීලී කෝටු විශේෂයක් භාවිත කෙරේ. කුල්ලේ වටට එම කෝටු තබා කිරිවැල් හෝ වේවැල් මගින් තද කොට බඳිනු ලැබේ. කුල්ලේ පැවැත්ම රඳා පවතින්නේ මෙම බැම්ම මත වීම නිසා එය ශක්තිමත් ව සකස් කර ගැනීම අත්‍යවශ්‍ය කාර්යයකි. කුල්ලේ ගැටිය බැඳීමේ දී කුලු කට්ට නමැති සියුම් උපකරණයක් භාවිත කර තිබේ (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016).

### කුල්ල සඳහා භාවිත රටා වර්ග

ඕනෑම කුල්ලක පතුරු ගළපා ඇති ආකාරය සියුම්ව නිරීක්ෂණය කරන කල විචිත්‍ර රටාවක් දැකිය හැකි ය. පැදුරුවල තරමට ම කුලුවල විශේෂිත රටා හඳුනාගත නොහැකි වුවද පාරම්පරික කුලු නිර්මාණ ශිල්පීන් පෙන්වා දෙන පරිදි කුලු රටා කිහිපයක් හඳුනා ගත හැකි ය. නාරි රටාව, දෙපත් රටාව, තනිපත් ඉරුව, පොල් අතු රටාව ඒ අතර වේ (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). ඉහළ සිට දෙපසට විහිදී ගොස් පහළට වන විට කුඩා වූ සෑම කුල්ලකම පාහේ සුලබව දැකිය හැකි රටාව නාරි රටාව වේ. දෙපත් රටාව හා තනිපත් ඉරුව වර්තමාන භාවිතයේ නොපවතී. පොල් අතු රටාව යනු පොල් අත්තක් විවීමේ දී භාවිත කෙරෙන රටාවයි (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016).

### කුලු සංරක්ෂණ ක්‍රමෝපායයන්

කුලු නිෂ්පාදනය මෙරට කුල ධූරාවලියේ එක්තරා කුලයක් සතු ජීවන වෘත්තියවේ. එහෙත් කුල්ල පරිහරණයේ දී කුල පිළිබඳ නියමයක් හෝ ස්ත්‍රී-පුරුෂ භේදයක් හෝ ක්‍රියාත්මක වූයේ නැත. කෘෂිකාර්මික කටයුතුවලදී පුරුෂයන් අත ගැවසුණු කුල්ලට වඩා ගෘහීය කටයුතුවල දී ස්ත්‍රීන් අත ගැවසුණු කුල්ල විවිධ වෙනස්කම්වලට භාජන විය. ඒ වෙනස්කම් සියල්ලම පාහේ කුල්ල ශක්තිමත් මෙවලමක් බවට පත්කර ගැනීමට කාන්තාවන් දැරූ ප්‍රයත්න වශයෙන් සිදු වූ ඒවා ලෙස සැලකීම වඩාත් සාධාරණය. එමගින් මෙරට සාම්ප්‍රදායික කාන්තාවන් සතුව පැවති පරිසරය පිළිබඳ අවබෝධය හා සරල තාක්ෂණය පිළිබඳ අවබෝධයෙහි පැතිකඩක් ද අනාවරණය වේ. බටපතුරු හෝ වෙනත් ශාක පත්‍ර භාවිතයෙන් නිමැවුණු කුලු කිසිදු වෙනස්කමකට භාජන කිරීමකින් තොරව ඒ අයුරින් ම භාවිත කිරීමේ දී එහි මධ්‍යයේ සිදුරු හටගෙන ධාන්‍ය පෙළීම් ආදියේ දී ඒ සිදුරු අතරින් ඒවා බිමට පතිත වීම සිදුවේ. මෙය කුල්ලේ පැවැත්මට මෙන් ම ධන-ධාන්‍යාදියේ විනාශයට ද බලපාන බව වටහාගත් මෙරට කාන්තාවන් විසින් කුල්ලේ හා ධාන්‍යවල පැවැත්ම උදෙසා ඒ සිදුරු මකා දැමීමට උපක්‍රම ගණනාවක් භාවිත කරනු ලැබ තිබේ. ඒ අතරින් බෙලි ලාටු භාවිතය, තිඹිරි ලාටු භාවිතය, ගොම භාවිතය, දහයියා භාවිතය සහ කොහොල්ලෑ භාවිතය කුල්ලේ සිදුරු මකා දැමීමට උපයෝගී කරගත් ප්‍රමුඛ උපක්‍රම කිහිපයකි.

### බෙලි ලාටු භාවිතය

සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බෙලි වෘක්ෂය අතර පවතින්නේ දෘඪතර සබඳතාවකි. පැරැන්නෝ වරෙක බෙලි වෘක්ෂයේ සකලාංග රෝග නිවාරණය විෂයෙහි ඖෂධයක් වශයෙන් යොදා ගත්හ. තවත් වරෙක එය මියුරු පලතුරු විශේෂයක් වශයෙන් භාවිතයට ගත්හ. ජෛන ආගමේ දී ලක්ෂ්මී දෙවඟනට වාසස්ථානය කර දීමෙන් අභෞතික සංස්කෘතියට ද එය සම්බන්ධ කර ගත්හ. බෙලි ගෙඩිය අභ්‍යන්තරයෙහි පවතින ලාටු භාවිතයෙන් පැරැන්නන්ගේ සියුම් තාක්ෂණය ද ශක්තිමත් කෙරිණ. කෙතරම් ශක්තිමත් ව නිර්මාණය කෙරුණ ද කුල්ලේ සිරස් සා තිරස් වියමන් අතර සිදුරු හටගැනීම වැළැක්විය නොහැකි ය. බෙලි ලාටු භාවිතය ඒ සිදුරු මකා දැමීම සඳහා අනුග මනය කෙරුණු ක්‍රමෝපායයන් අතුරින් එකකි. ශ්‍රී ලංකාවේ බහුලව වැවෙන බෙලි ශාකයේ හට ගන්නා ගෙඩි කිහිපයක් ගෙන තම්බා ඒවායෙහි මද ඉවත් කරගෙන, තරමක් ඝන මිශ්‍රණයක් වශයෙන් සකසාගෙන කුල්ලෙහි පිටුපස සෑම ස්ථානයක් ම ආවරණය වන පරිදි ගා ගැනීමෙන් අනතුරුව පිරිසිදු කපු රෙදි කැබැල්ලක් ගෙන ඒ මිශ්‍රණය වැසෙන සේ අලවා අව්වේ වේළෙන්නට තබා ගැනීමෙන් කුල්ලේ සිදුරු හටගැනීම වළක්වාගැනීමට මෙන් ම එය කෘමිසතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ද හැකි ය (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016).

### තිඹිරි ලාටු භාවිතය

තිඹිරි යනු ලංකාවේ බොහෝ ප්‍රදේශවල බහුලව වැවෙන ශාකයකි. එහි ඵල හෙවත් ගෙඩි, ස්වරූපයෙන් මැංගුස් නමැති පලතුරු හා අත්‍යන්තයෙන් සමීප ය. මෙම තිඹිරි ගෙඩි කිහිපයක් රැගෙන වංගෙඩියෙහි දමා හොඳින් පොඩිවන සේ කොටාගෙන එම මිශ්‍රණය කුල්ලේ පිටුපස ඝන ස්ථරයක් සේ අතුරා එය වැසෙන සේ පිරිසිදු කපු රෙදි කැබැල්ලක් අලවා මඳ අව් රශ්මියේ තබා වේළෙන්නට හැර භාවිතයට ගැනීමෙන් එහි ආයු කාලය දීර්ඝ කර ගැනීමට සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය කාන්තාවන් විසින් සකසා ගැනුණු ක්‍රමවේදය මගින් ස්වභාවධර්මය සමඟ ඔවුන් පැවැත්වූ අත්‍යන්ත ගනුදෙනුව මෙන් ම ඔවුන් සතුවූ තාක්ෂණික දැනුම ද ප්‍රකාශවේ (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016).

## ගොම භාවිතය

සත්ත්ව ප්‍රජාව ගෘහාශ්‍රීකරණය මානව පරිණාමයේ අතිශය වැදගත් සන්ධිස්ථානයකි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකන කල, එසේ ගෘහාශ්‍රීකරණය වූ සතුන් අතුරින් ගවයා ප්‍රමුඛස්ථානයට පත් ව ඇත්තේ මානවයාගේ භෞතික මෙන් ම ආධ්‍යාත්මික ජීවිතයේ බොහෝ අවස්ථාවන් සමඟ දෘඪතර සබඳතාවක් දක්වා ඇති බැවිනි. ගවයාගෙන් ලැබුණු කිරි, පස්ගෝරස වැනි භෞතික සම්පත් තරමට ම ගොම ද සිංහලයාට අත්‍යන්තයෙන් ම ප්‍රයෝජනවත් විය. පුරුෂ පාර්ශ්වය විසින් කෘෂිකර්මාන්තය සඳහා පොහොරක් වශයෙන් ප්‍රයෝජනයට ගැනුණු ගොම, ස්ත්‍රී පාර්ශ්වය විසින් ද විවිධ අවශ්‍යතා සඳහා යොදාගෙන තිබේ. කුල්ලේ ප්‍රයෝජනවත්භාවය වර්ධනය කර ගැනීමට හා ආයුකාලය දීර්ඝ කර ගැනීමට කාන්තාවන් විසින් අනුගමනය කෙරුණු ක්‍රමෝපායයන් අතුරින් ගොම භාවිතය ද විශේෂයෙන් සාකච්ඡා කළ යුතු කරුණකි. භාරතීය සංස්කෘතියෙහි ගවයා මෙන් ම ගොම ද පූජනීය වස්තූන්ය. සාම්ප්‍රදායික සිංහල සංස්කෘතියෙහි ද ගවයා මෙන් ම ගොම ගැමියාට නැතුව ම බැරි වස්තූන් අතර විය. සාම්ප්‍රදායික ගෘහණියෝ ස්වකීය ගෘහය ඇතුළත භූමියෙහි ගොම ආලේප කළෝ එහි පවතින විෂබීජ නාශනය කිරීමේ හැකියාව මැනැවින් වටහාගෙනය. ඔවුන් විසින් ගෘහස්ථ උත්සව විෂයෙහි ගෙබිම නවීකරණය කෙරුණේ ගොම භාවිතයෙනි. නිවසෙක මරණයක් සිදු වී අදාළ මෘතශරීරය ඉවත් කෙරුණු පසු ගෙබිම පිරිසිදු කෙරුණේ ද ගොම භාවිතයෙනි. මේ අනුව ගොම හා ඔවුන්ගේ දෛනික ජීවිතය අතර පැවති දෘඪතර සබඳතාව වටහාගත හැකි ය. කුල්ල කල්තබා ගැනීමේ දී ද ගොම භාවිත කිරීමට පෙලඹීම මගින් එකී සබඳතාව තව තවත් තහවුරුවේ. මේ සඳහා ඔවුන් විසින් භාවිත කරනු ලැබ ඇත්තේ ගවයින් පිට කරන අලුත් ගොම ය. මේවා ඝන තලපයක් ලෙස සකස් කරගෙන කුල්ලේ පිටුපස ඝන ස්ථරයක් සේ අතුරා එය වැසෙන සේ පිරිසිදු කපු රෙදි කැබැල්ලක් අලවා මඳ අව් රශ්මියේ තබා වේළෙන්නට හැර භාවිතයට ගැනිණි (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016).

## දහයියා භාවිතය

වී සහල් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ දී නිකුත් වන දහයියා කුඩු ජලය සමඟ මිශ්‍ර කොට ඝන තලපයක් ලෙස සකසාගෙන කුල්ලේ පිටුපස ආලේප කර ඒ මත පිරිසිදු කපු රෙදි කැබැල්ලක් අලවා වේළෙන්නට හැරීම කාන්තාවන් කුලු සංරක්ෂණය සඳහා යොදාගත් තවත් උපක්‍රමයකි (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). ඒ ආකාරයට ම ඝනකමට සකසා ගැනුණු බත් කැඳ ආලේප කර ඒ මත පිරිසිදු කපු රෙදි කැබැල්ලක් අලවා වේළෙන්නට හැරීම තවත් සංරක්ෂණ විධියකි.

## කොහොල්ලෑ භාවිතය

ශ්‍රී ලංකාවේ වැවෙන ශාක අතුරින් කොස් තරම් පැරැන්නන්ට සමීප වූ වෘක්ෂයක් නොමැති තරම්ය. ඔවුන් එය බත්ගස වශයෙන් හැඳින්වූයේ සාම්ප්‍රදායික ආහාර සංස්කෘතිය සමඟ පැවති අත්‍යන්ත සබඳතාව හේතුවෙනි. ව්‍යංජනයක්, පලතුරක්, ඖෂධයක් වශයෙන් මෙන් ම ගෘහ නිර්මාණ කාර්යයේ දී යොදා ගැනුණු ශක්තිමත් දැව විශේෂයක් වූ කොස් ගසෙහි ඵලයෙන් ඉවත් කෙරෙන කොහොල්ලෑ ද පැරැන්නෝ බහුවිධ කාර්යයන් සඳහා යොදා ගත්හ. කෘෂිකාර්මික කටයුතුවල දී කෘමි සතුන් නාශනයට භාවිත කෙරුණු කෙම් සඳහා මෙන් ම මැටිභාණ්ඩ, පිඟන්, කෝප්ප, කුලු වැනි දීර්ඝ කාලයක් පරිහරණය කිරීම නිසා තැන-තැන කඩතොලු ගැසුණු භාණ්ඩ, භාවිතයෙන් ඉවත් නොකර ප්‍රයෝජනයට ගැනීමට ද ගැමි කාන්තාවෝ කොහොල්ලෑ යොදාගත්හ. "කුල්ල කැඩී සිදුරු වූ විට එහි කොහොල්ලෑ තබා ඒ මතු පිට රෙදි කැබැල්ලක් අලවා අලුත් වැඩියා කර ගනිති" (Gunasoma, 2002, p. 29). භාවිතයෙන් ඉවත් කළ යුතු කුලු කල්තබා ගනීම සඳහා ඔවුන් කොහොල්ලෑ භාවිතයට ගත් ආකාරය පූර්වෝක්ත උද්ධෘතයෙන් පැහැදිලිවේ.

## භෞතික මෙවලමක් වශයෙන් කුල්ලෙහි භාවිතය

කෘමිනාශක භාවිතයෙන් සම්පූර්ණයෙන් ම තොරවූ සාම්ප්‍රදායික ගොවීහු පලිබෝධයින් පළවා හැරීම උදෙසා "රෝග නිවාරණාදිය සඳහා කරන ක්‍රියාව හා ආරක්ෂාව යන අරුතැති" (Soratha himi, 1998, p. 292) විවිධ කෙම්ක්‍රම භාවිත කළහ. එහි දී වගාවට හානි කරන කෘමිසතුන් ග්‍රහණය කර ගැනීම සඳහා භාවිතයට ගෙන ඇත්තේ කොහොල්ලෑ ගාන ලද කුල්ලකි. කුල්ල නිර්මාණය වන්නේ කිසියම් කුලයක උරුමය පාදක කරගෙන වුව ද කුල්ල භාවිතය සම්බන්ධයෙන් පවතින්නේ ඊට වඩා වෙනස් වූ ස්වභාවයකි. කුල්ල අත්‍යවශ්‍ය ම මෙවලමක් වූයේ ගොවීන්ට ය; ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතුවලටය. වර්තමානයෙහි මෙන් දියුණු තාක්ෂණික මෙවලම් නොවූ යුගයක පරිහරණයට සුදුසු අන්දමින් වී සකස් කරගැනීම උදෙසා ගොවීන්ට කුල්ල නැතිව ම බැරි මෙවලමක් විය. විශේෂයෙන් ම කමතේ සිට නිවෙස්වලට වී රැගෙන ඒමට පෙර ඔවුහු පිදුරු සහ බොල් ඇට ඉවත් කර ගැනීම සඳහා කුල්ල කේන්ද්‍රීයව සිදු කළ කාර්යය කමත් භාෂාවේ දී හැඳින්වෙන්නේ කුරාල බැඳ එහි නැඟ වී සුළං කිරීම හෙවත් බැත ගැරීම යනුවෙනි. "රාහි කරගත් බැත පාහින්නේ යතුරෙනි. පාහිනවා යනු හුළං කිරීම වන අතර යතුර යනු කුල්ල ය. එසේ ම හුළං අඩු කාලයේ දී නම් බැත මුක්කාලියක සිට ගැරිය යුතු ය. එවිට බැත ගැරී කමතට වැටෙද්දී යතුරු මාරුව යොදා දෙන්නෙක් ඒවා හුළං කරති. කමතේ එහාට මෙහාට ගෙන යා හැකි පරිදි කත්තිරි කාල යොදා සාදන ලද උස මැස්ස මුක්කාලිය වන අතර කුරාලය යන පදය ද භාවිත කරති. එහි උඩ සිට කුල්ලෙන් පහළට බැත හැළීම සුළං කිරීම හෙවත් බැත ගැරීම වෙයි. එවිට කුල්ලෙන් පවන් ගැසීමටය යතුරු මාරුව කියනුයේ" (Manewa, 2004, p. 221).

පවිත්‍ර වූ භෝගයක් වශයෙන් නිවෙසට රැගෙන ආ වී භාවිතයෙන් පැරණි සිංහලයා සිදුකළ පළමු කාර්යය වූයේ අස්වනු සරු කර ගැනීම උදෙසා පිහිට වූයේ යයි විශ්වාස කෙරෙන දෙවිවරුන්ට කෘතගුණ දැක්වීම සඳහා බුදුන් වහන්සේ ප්‍රමුඛ තන්හි තබාගෙන කිරි ඉතිරවීමය. මෙම කිරි ඉතිරවීම් මංගල්‍යයේ දී ද කිරි ඉතිරුම් මුට්ටියට ගිනි බෝ කිරීම සඳහා යොදාගෙන ඇත්තේ කුල්ල ය. "සඳුන් දර හෝ පැඟිරි දර හෝ බත පිසීම සඳහා පාවිච්චි කිරීම සාමාන්‍ය සිරිතයි. කටින් පිඹ ලිප ගිනි මොළවනු වෙනුවට කුලුවලින් පවන් සැලීමෙන් එය කෙරෙනුයේ පරිපූර්ණ පාරිශුද්ධත්වය ආරක්ෂා කිරීම පිණිස ය" (Senarathne, 1994, p. 32). ගිනි බෝකිරීම යනු අළු ඉවත් කර ලිපෙහි ගිනි ඇවිලවීමය. සාමාන්‍යයෙන් ආහාර පිසීමේදී ගෘහිණියන් විසින් සිදු කරනු ලබන්නේ කටින් පිඹ ලිපෙහි ගිනි අවුළුවා ගැනීම ය. එසේ කටින් පිඹීමේ දී කෙළ විසිවීමෙන් බුදුන්වහන්සේත්

දෙවිවරුනුත් පිදීම උදෙසා සකස් කෙරෙන මෙම කිරිබත ඉඳුල් වීම වැළැක්වීමට කුල්ල භාවිත කිරීම සිදුවී තිබේ.

කුල්ල හා මුළුතැන්ගෙය අතර පවතින්නේ ද දෘඪතර සබඳතාවකි. කුල්ලක් නොඑල්ලන ලද බිත්තියක් සහිත මුළුතැන්ගෙයක් නොමැති තරම්ය. උස්-පහත් භේදයකින් තොරව සෑම කුලයක ම කාන්තාවන් විවිධ විෂයක අවශ්‍යතා සඳහා කුල්ල භාවිත කිරීම ඊට හේතුවය. කුඹුරෙන් නිවසට රැගෙන ආ වී තැම්බීම පිණිස හෝ කැකුළු සහල් ලබා ගැනීම සඳහා බොල් ඉවත් කර ගැනීම පිණිස කුල්ල නැතිව ම බැරි මෙවලමක් විය. වී සහල් බවට පරිවර්තනය වීමෙන් අනතුරුව ඒවායෙහි පවතින දහයියා ඉවත් කර ආහාරයට සුදුසු පරිදි සකස් කර ගැනීම සඳහා පොළා ගැනෙන්නේ ද කුල්ලේ ආධාරයෙනි. මේ ක්‍රියාවලිය නිසා ම කුලු වර්ග අතරට සහල් කුල්ල යන විශේෂිත නාමය එක්වී තිබේ. ආහාර සකස් කිරීමේ දී ගෙවත්තෙන් හෝ අවට පරිසරයෙන් නෙළා ගැනුණු පලාවර්ග මැල්ලුමකට හෝ ඇඹුලකට සුදුසු පරිදි තෝරා ගැනෙන්නේ කුල්ලේ දමා තුනී කර ගැනීමෙනි. මුළුතැන්ගෙහි පරිහරණයට අවශ්‍ය මිරිස්, මුං, කව්පි, අබ, කුරහන්, මෑ ඇට වැනි දෑ අව්වේ තබා වියළා ගැනුණේ ද කුල්ලේ ආධාරයෙනි.

"කිතුලානේ පිළ පිට මම ඉන්න කොට  
රොටී උයා ගොඩ ගැසුවයි කුල්ලකට  
හදා බෙදා කමු කියලා ඉන්න කොට  
රොටී ගියා කිතුලානේ පිළ දිගට"  
(Siripala, 2006, p. 23).

පූර්වෝක්ත ජනකවියට අනුව පිසින ලද ආහාර අසුරා තැබීම සඳහා ද කුල්ල භාවිත කර තිබේ. සාම්ප්‍රදායික සිංහල කාන්තාවන් අතර පැවති උත්කෘෂ්ට ගුණාංගයක් පිළිබිඹු කෙරුණු ගති ලක්ෂණයක් වූයේ සකසුරුවමය. ආහාර පිසීම සඳහා නැඹිලියට ගත් සහල්වලින් මිටක් වෙන ම මුට්ටියක තැන්පත් කිරීමෙන් පමණක් නොව පිසූ බත් ඉතිරිවූ පසු ඒවා අව්වේ දමා වියළා ගෙන අග්ගලා වැනි ආහාර සකස් කිරීම පිණිස සකසා ගැනීමෙන් ද ඔවුන්ගේ ඒ සකසුරුවම ප්‍රදර්ශනය වේ (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). මේ පිසූ බත් වේලා ගැනීම සඳහා ද කාන්තාවන් විසින් භාවිතයට ගැනුණේ කුල්ල ය. මෙලෙස ඉවුම්-පිහුම් අවශ්‍යතා උදෙසා පමණක් නොව ඒ අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නා තුරු කුඩා දරුවන් නොහඬවා නළවා ගැනීමටත් කාන්තාවන්ට පිහිට වූයේ කුල්ලය. කුඩා දරුවන් කුල්ලේ තබා එහි දෙපැත්තෙන් සෙලවීම දරුවන් නිද්‍රා කරවන සුළු ය. එබැවින් කාන්තාවෝ එම කාර්යය සඳහා ද කුල්ල භාවිතයට ගත්හ.

## කුල්ල සමාජ චර්යාත්මක සංකේතයක් ලෙස භාවිත කිරීම

සාම්ප්‍රදායික සිංහලයින්ගේ ජීවිතය හා චාරිත්‍ර-වාරිත්‍ර අතර පවතින්නේ අවියෝජනීය සබඳතාවකි. ආගම්විෂයක, සමාජවිෂයක හා ගෘහස්ථ චාරිත්‍ර යන සෑම අවස්ථාවක් සඳහාම කුල්ල භෞතික ව මෙන් ම සංකේතාත්මක ව භාවිතවේ.

## අළුහන් වැඩීම

වී ගොවිතැන සම්බන්ධයෙන් සාම්ප්‍රදායික සිංහලයා අනුගමනය කළ, "කමත් චාරිත්‍ර අතුරින් ඉතා වැදගත් තැනක් ගන්නා සිරිතකි අළුහන් වැඩීම. අළුහන් වැඩීම යන්න වචනාර්ථ වශයෙන් ගතහොත් අළුවලින් සන් හෙවත් සංඥා යෙදීම ලෙසින් හැඳින්විය හැකි ය. අළුසන් යන්න පසුව අළුහන් වී යැයි සිතිය හැකි" (Kahandagamage, 1991, p. 35). කමතට ගොයම් දැමීමේ අවස්ථාව හා බැඳුණු මේ චාරිත්‍රය සඳහා යොදා ගැනෙන්නේ කුල්ලෙන් පොළා කුණු රොඩු ඉවත් කර පවිත්‍ර කර ගැනුණු අළු ය. මෙලෙස පිරිසිදු කර ගැනුණු අළු භාවිතයෙන් කමතේ අඳිනු ලබන අළු චක්‍රවලට කමත් යන්තරේ යන නම භාවිත කෙරේ. මෙහි අඳින රූප අතර කුල්ල, දෑකැත්ත, උකුණු ගස, බෝල් අත්ත වැනි ගොවි උපකරණවලට මුල් තැනක් දෙනු ලැබේ" (Dissanayake, 2010, p. 109).

"බන්දවාන කුලු යතුරු සදාලා  
කැන්දවාන දෙදෙනෙකුට කියාලා  
අන්දවාන අළු යන්තර ඇඳලා  
කන්ද බැඳන පැහැපන් බැත ඇරලා"  
(Sirisena, 2006, p. 49)

යන ජනකවියෙන් ද අළුහන් වැඩීමේ චාරිත්‍රය පිළිබඳ කරුණු අනාවරණය වේ.

## ගෘහ ප්‍රවිෂ්ටය

සාම්ප්‍රදායික සිංහලයින් අභිනවයෙන් ගෘහයක් නිර්මාණය කරගැනීමෙන් අනතුරුව ගෘහ ප්‍රවිෂ්ටය සිදු කරන ලද්දේ ද උත්සවාකාරයෙනි. සාමාන්‍යයෙන් ගෘහ ප්‍රවිෂ්ටයක දී මුලින් ම අභිනව ගෘහයට ඇතුළු වන්නේ කාන්තාවකි. මුළුතැන්ගෙයකට අවශ්‍ය කුළුබඩු, ලුණු, හාල්, කරවල, දැල්වූ පහනක් හා එලවළු පිරවූ කුල්ලක්ද අතැතිව ඇ ප්‍රවිෂ්ට වීමෙන් ඒ සඳහා කුල්ලේ දායකත්වය හඳුනාගත හැකිය (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016).

## මල්වර චාරිත්‍ර

උපතේ සිට මරණය දක්වා ම සිංහලයින් විසින් අනුගමනය කෙරෙන චාරිත්‍ර-වාරිත්‍ර අතර මල්වර චාරිත්‍රවලට විශේෂ ස්ථානයක් හිමිවේ. කාන්තාවකගේ ජීවිතයේ අතිශය වැදගත් සන්ධිස්ථානය වශයෙන් සැලකෙන මල්වරය හා බැඳුණු චාරිත්‍ර-වාරිත්‍ර ගණනාවකි. දින ගණනාවක් පුරා සමාජයෙන් හා මිනිසුන්ගෙන් දුරස්ව සිටි මල්වර වූ කාන්තාව අදාළ චාරිත්‍රානුකූල ව ස්නානය කිරීමෙන් අනතුරුව පළමුව පිවිසෙනුයේ පස්මෝරු, වී, සහල්, පොල් ගෙඩියක්, පලතුරු හත් වර්ගයක්, කණ්ණාඩියක්, කිරි කළයක් හා කුල්ලක් සහිත සඩංගම් වීදියට ය. "සඩංගම් වීදිය යනු අංග හයකින් යුක්ත වූ වීදිය හෙවත් වින්‍යාසයයි. වින්‍යාසය යනු යමක් පිළිවෙළට තැබීමයි" (Jayathilaka, 1993, p. 106). ඒ අනුව මේ දැරියගේ ජීවිතයට පිළිවෙළ පිළිබඳ පාඩම ඉගැන්වෙන්නේ කුල්ල ද ඇතුළත් සඩංගම් වීදිය ඇසගැස්වීමෙනි. කොටහළු මගුල් දිනයෙහි දැරියගේ ඇවැස්ස මස්සිනා කැවිලිවලින් පිරවූ කුල්ලක් මල්වර තරුණියගේ නිවසට එවීමේ සිරිතක් ද ඇතැම් ප්‍රදේශවල භාවිත වී තිබේ. එමඟින් දැරිය මස්සිනාගේ අනාගත භාර්යාව බව සංකේතාත්මක ව පැවසේ. මේ සඳහා කුල්ල ම භාවිතයට ගැනෙන්නේ එය, ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොරව බහු කාර්ය අවශ්‍යතා භෞතිකව මුදුන්පත් කෙරෙන තවත් අභෞතික ප්‍රයෝජන ගණනාවක් සමඟ අත්‍යන්තයෙන් ම බැඳුණු මෙවලමක් බැවිනි. දැරියක මල්වර වූ අවස්ථාව කිසියම් අසුභඵල උදා කෙරෙන්නක් වුවහොත් ඒ සඳහා කොටහළු යාගය පැවැත්වීම ද පැරණි චාරිත්‍රයකි. කාන්තාවන්

විසින් පවත්වනු ලබන අතලොස්සක් චාරිත්‍ර අතුරින් එකක් වන මෙම කොටහළු යාගය පැවැත්වීමට 'කොළ මඩුව' නම් වූ විශේෂ මණ්ඩපයක් සාදා ගැනේ. ඒ මත කළාලයක් එළා යාගයට යොදා ගැනෙන පිදුම් ද්‍රව්‍ය තැන්පත් කෙරෙයි. එම පිදුම් ද්‍රව්‍ය සහිත කළාලය "පිදුම් කරච්චිය" නමින් හැඳින්විණ. ඊට වී, සහල්, පොල්, පස්මෝරු කුල්ල, මල්විල, මෝල්ගහ හා මල් බුලත් තට්ටුව ඇතුළත් වේ" (Ihalagama, 1997, p. 25).

"කල්ල කොමට යකු කුරිරු
එල්ල ගමන් එන නුදුරු
කුල්ල දුන්නොත් පස් මෝරු
කිල්ල දෝස දුරීන් දුරු"

(Dissanayake, 2004, p. 117)

යන පද්‍යයෙන් ද කොටහළු කිල්ල නම් ශාන්තිකර්මය සඳහා කුල්ල භාවිත කෙරෙන ආකාරය පිළිබඳ සාක්ෂ්‍ය සැපයෙයි.

**විවාහ චාරිත්‍ර**

ශ්‍රී ලාංකේය ගෘහස්ථ චාරිත්‍ර අතුරින් විවාහ චාරිත්‍රවලට ද විශේෂ ස්ථානයක් හිමිවේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන විවාහ ක්‍රමය වූයේ ඒකීය විවාහයයි. මාතෘ මූලික සමාජ පීතෘ මූලික සමාජ බවට පත්වීමෙන් පසු ඒ දිගු මානව ඉතිහාසය තුළ සමූහ විවාහ, බහු පුරුෂ සහ බහු ස්ත්‍රී විවාහ ප්‍රතික්ෂේප වී ගියේ ය. නමුත් ශ්‍රී ලංකාවේ විවාහ චාරිත්‍ර සැලකීමේ දී විශේෂිත අවස්ථාවක් මධ්‍යම පළාතේ මහනුවර රාජධානිය පැවති යුගයේ තිබූ බහුපුරුෂ විවාහ (Tambiah, 2011) ලෙස සැලකේ. විවාහය හා බැඳුණු පෝරුවේ චාරිත්‍ර ඉටු කිරීමෙන් අනතුරුව මනාල යුවලට ඇතැම් පළාත්වල මුලින් ම දර්ශනය වීමට සලස්වන්නේ පස්මෝරු කුල්ල, මල්විල, බුලත්තට්ටුව, වී, සහල්, පොල්, මෝල්ගහ යනාදි ද්‍රව්‍යවලින් සමන්විත සඩංගම් වීදියයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල පෝරුවේ චාරිත්‍ර හා තදනුබද්ධව කුල්ල යොදා ගැනෙන මීට වඩා වෙනස් ස්වරූපයක් ගන්නා චාරිත්‍ර විධියක් ද පවතී. එනම්, මලක් පරිදි සැකසෙන සේ පෝරුව ඉදිරිපිට කුලු හයක් (කුල්ලේ බොක්ක මැදට වන පරිදි) තබා එම කුලු හය කැවිලි, එලවළු, පලතුරු, සහල්, කිරිබත් හා බුලත්-පුවක් යන ද්‍රව්‍යවලින් පුරවා පෝරුවෙන් බසින මනාල යුවලට දකින්නට සැලැස්වීමය. එමඟින් ඔවුනගේ ජීවිතවලට සෞභාග්‍යය උදාවන බව පැරැන්නන්ගේ විශ්වාසය විය. නුවරකලාවියේ චාරිත්‍ර-වාරිත්‍ර පිළිබඳ සිදු කෙරුණු පර්යේෂණයකදී ද මේ සඩංගම් වීදිය හා කිරි ඉතිරවීම සම්බන්ධයෙන් අනාවරණය කර තිබේ; " මඟුල් පෝරුවට යාවී ඇති සඩංග වීදියට මෙපිට සිට ඥාතීහු මනාල යුවළට සුභ පැතීමට රැස්ව සිටිති. "පෝරු හැල්ල" නිම වී දැනමුත්තාගේ උපදෙස් මත මනාල යුවළ සඩංග වීදියට බසිනුයේ පොල් ගෙඩිය බිඳීමත් සමඟය. සඩංග වීදියට ප්‍රවිෂ්ට වන මෙම යුවළට ඉදිරියෙන් දර්ශනය වන්නේ හේනයා විසින් ආවරණය කරන ලද තිරය පමණි. මුට්ටියේ කිරි ඉතිරී යද්දී තිර රෙද්ද ඉවත් කෙරේ. එවිට සඩංග වීදි ගත මනාල යුවළට ඇස ගැටෙනුයේ සශ්‍රීකත්වයෙන් අනූනව පිටාර ගලන කිරි ඉතුරුමයි" (Manewa, 2004, pp:123-124). විවාහයක දී මනමාලියගේ පාර්ශ්වයෙන් මනාල පාර්ශ්වය වෙත ප්‍රදානය කෙරෙන බඩු-භාණ්ඩ අතරට ද කුල්ල අනිවාර්යයෙන් ම ඇතුළත් වන බව පැරැන්නෝ පවසති (ක්ෂේත්‍ර සාකච්ඡා, 2016). මහනුවර රාජධානි යුගයේ දී මෙරට ක්‍රියාත්මක වූ සමගි විවාහ ක්‍රමය හෙවත් එකගෙයි කෑම පවත්වාගෙන යාමේ දී ද කුල්ල නැතිව ම බැරි මෙවලමක් වී තිබේ. මෙම විවාහ ක්‍රමයේ දී "අයියා මලෝ දෙන්නම එකම මායියාවක් එක්ක පවුල් කෑහ. තම අයියණ්ඩි පැලේ දොරකඩට කුල්ල මාදා කළ විටක මල්ලී පැළට ගොඩ නොවීමත්, එසේම තම මලයණ්ඩි දොරකඩට කුල්ල මාදා කළ විටෙක අයියා පැළට ගොඩ නොවීමත් එක ගේ කෑමේ අපූරු සිරිත විය" (Manewa, 2004, p. 224; Tambiah, 2011). හේන් සහ කුඹුරු ගොවිතැන ජීවනෝපාය කරගත් සාම්ප්‍රදායික ගොවීහු ඒ වෙනුවෙන් දැඩිලෙස කැපවූහ; විශේෂයෙන් ම පැල් රැකීමේ කාර්යයේ නිරතවීමේ දී ස්වකීය කායික හා මානසික අවශ්‍යතා පවා අමතක කළහ. පැල් රැකීමට නිවෙසින් බැහැරවීමත් විස්තෘත පවුලක එකට යාබදව නිවෙස් ඉදිකරගෙන ජීවත්වීමත් හේතුවෙන් මස්තකප්‍රාප්ත කර ගත නොහැකි වූ ඔවුන්ගේ ලිංගික අවශ්‍යතා ඉටු කරගත් ආකාරය "ඒ කාලේ එක යටලීයේ ගෙවල් හින්දා හතර වරිගේ උන් හතර පැත්තෙන්ම එනවා යනවා. ඒ වෙලාවට ඒ ඇත්තන් ඉන්න ගේ දොරකඩට කුල්ල හරස් කරලා තමුංගේ ඕනෑ එපාකං ඉෂ්ට කර ගත්තා. දොරට කුල්ල හරස් කරලා තිබ්බාම දරුවන් වත් ඒ පැත්තට නොයවන්ඩ අනික් අය වග බලා ගත්තා. මේ දෙන්නා මේ විදිහට මුඩු වෙන කාරියට ඒ කාලේ කිව්වේ පැල් පේ කරනවා කියලා. ඒකේ තේරුම හාර මහක් පැල් ලඟින ඇත්තන්ට ඉඩ කඩ ලබා දෙනවා කියා කියන එකයි" (Kumarasinghe, 2006, p. 36) යන්නෙන් පැහැදිලිවේ. අතීතයේ සිදු කෙරුණු මෙම කුල්ල පේ කිරීමේ සම්මත චාරිත්‍රය සිදු කළ හැකිව තිබුණේ තම ගෙදර බිරිඳ සමඟ පමණි. වෙනත් බිරිඳක් සමඟ කුල්ල පේ කිරීමේ චාරිත්‍රය කිරීම තහංචි වේ. කුල්ල පේ කිරීමේ චාරිත්‍රය අහවර වූ විගසම දොරකඩ අටවා ඇති කුල්ල ගේ ඇතුළට ගැනීම සිරිත වේ. මෙමඟින් ගං ගෙදරට පිටතින් කාටවත් ඇතුළු විමට තිබූ සමාජ සම්මත තහංචිය අහෝසි වී යන බව ඇඟවේ (Dalupotha, 2003, p. 130). මේ අනුව කුල්ල පූර්වෝක්ත කාර්යයේ දී භෞතික ව මෙන් ම අභෞතික ව ද සම්බන්ධ වන ආකාරය හඳුනාගත හැකි ය.

**අවමංගල චාරිත්‍ර**

මානව ජීවිතයේ අවසාන අදියරේ දී සිදුකෙරෙන අවමංගල චාරිත්‍රයේ දී ද ගැමියාට කුල්ල නැතිව ම බැරි මෙවලමක් වූ බව පෙනේ. මරණයට පත්වූ පුද්ගලයාගේ ඊළඟ ආත්මභවය වඩාත් යහපත් කරනු පිණිස ස්වකීය ඥාතීන් විසින් චාරිත්‍ර-වාරිත්‍ර රාශියක් ඉටු කෙරේ. "පානම ජනතාව භූමිදානය සඳහා මිනිය නිවසින් බැහැරට ගෙන ගිය පසු ප්‍රේත තටුව දේහය තිබූ කාමරයේ තැනක තබති. කුල්ලට කෙහෙල් කොළයක් තබා ඒ මත තටුව සකසන ඔවුහු කුල්ල පිටින්ම වත්තෙන් එපිට ඈතට ගෙන ගොස් තබති" (Kahandagamage, 1999, p. 149). පානම ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ මේ චාරිත්‍රය සත්කෝරලයේ ගල්ගමුව ප්‍රදේශයේ ජනතාව අතර ද ක්‍රියාත්මක වේ.

**ශාන්තිකර්ම හා කුල්ල**

දාර්ශනික බුද්ධාගමට සමගාමීව ජනආගම ද සාම්ප්‍රදායික සිංහලයින් අතර පැවතිණි. ලෙඩරෝගවලින් ආරක්ෂාවීම, දරුඵල ලබාගැනීම, යක්ෂ-භූත-ප්‍රේතාදීන්ගෙන් සිදුවන අහිතකර බලපෑම් දුරුකිරීම හා කෘෂිකාර්මික කටයුතුවලින්

සරු අස්වනු ලබාගැනීම වැනි ලෞකික අරමුණු මස්තකප්‍රාප්ත කර ගැනීම උදෙසා අනුගමනය කෙරුණු සිංහල බුද්ධාගමට හෙවත් ජනආගමට අයත් අභිචාරවිධි රාශියක් පවතී. දෙවියන්, යක්ෂයින් හා නවග්‍රහයින් උදෙසා සිදුකෙරෙන මේ අභිචාරවිධි බහුතරයකට භෞතික හා අභෞතික යන දෙපාර්ශ්වයෙන් ම කුල්ල සම්බන්ධ වනු දැකිය හැකි ය. "මන්ත්‍ර බලයෙන් කුල්ලක් ගමන් කරවීම විශේෂයෙන්ම සොරුන් පිළිබඳ තොරතුරු දැන ගැනීමට මතුරන ලද එම කුල්ල උපයෝගි කර ගැනීම" (Liyanage, 1996, p. 89) යන අරුතැති කුලු කැරකිල්ල (මන්ත්‍ර) නම් පැරණි අභිචාරවිධිය පවත්වා ඇත්තේ හොරු ඇල්ලීම, ආතුරයෙකුට ලෙඩ රෝග පමුණුවන්නා වූ යකුන් හා ප්‍රේතයින් හඳුනා ගැනීම, කිසියම් පුද්ගලයකුට හදි-හූනියම් කරන්නන් හඳුනාගැනීම වැනි අරමුණු විෂයෙහි ය.

### කොහොඹා කංකාරිය

අතීතයේ පඬුවස්දෙව් රජතුමාට හටගත් දිවි දෝෂයක් සන්සිඳවීමේ අරමුණින් පැවැත්වූ බව පැවසෙන කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දී සිදු කෙරෙන එක් චාරිත්‍රයක් වන කුල්ල පේ කිරීම සඳහා ඍජුව ම කුල්ල භාවිත කෙරේ;

"කුල්ල පේ කරලා
ගෙනත් රත්මල් බැඳලා
වස වැල සරහලා
සෑම දිවි දොස් හරින හලබා"

(Dissanayake, 1998, p. 50).

බත්, වට්ටක්කා, අළු කෙසෙල්, කරවල යනාදියෙන් සමන්විත ව සැකසූ ගොටුවක් කුල්ල මත තබා සිදුකෙරන මේ පූජාව කඩවර ගොටුව යන විශේෂ නාමයෙන් හැඳින්වෙන අතර දිවිදොස් දුරුවී සෙත්ශාන්තිය ලබා ගැනීම එහි අරමුණ බව පූර්වෝක්ත පද්‍යයෙන් ද කියැවේ.

### කඩවර කංකාරිය

වරෙක දෙවියකු වශයෙන් ද තවත් වරෙක යක්ෂයකු වශයෙන් ද සැලකෙන කඩවර උදෙසා සිදුකෙරෙන ශාන්තිකර්මයේ දී කුල්ලේ තටුවට තබා කඩවරයින්ට පිදේනි දීමේ චාරිත්‍රය කුල්ල සම්බන්ධ වූ තවත් අභිචාර ක්‍රමයකි.

"අසුර රජුන් හට දිවැස් බලන්නේ
කුල්ලේ තටුවෙන් දෝස හරින්නේ"

(Karunarathna, 2001, p. 50)

යන පද්‍යාර්ධයෙන් ද මේ ශාන්තිකර්මයේ දී සිදුකෙරෙන කුල්ලේ තටුවට තබා කඩවරයින්ට පිදේනි දීමෙන් ද සෙත්-ශාන්තිය අපේක්ෂා කළ බව පැවසේ.

### රිද්දි යාගය

රටයකුම, "රිද්දි යාගය හෙවත් රිද්දි මංගල්‍යය" (Kottagoda, 1998, p. 34) යන නාමයෙන් ද හැඳින්වෙන දරුඵල අහිමි කාන්තාවන් විෂයෙහි පැවැත්වෙන පහතරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මයකි. "ප්‍රධාන යකුන් වන කලු යකාට, රීරි යකාට, මහසෝන් යකාට දෙන ප්‍රධාන පිදේනිවලට අමතරව වෙනත් තොවිල්වල දී නොදෙන පිදේනි කිහිපයක්ද" (Kariyawasam, 1995, p. 19) සහිත මේ ශාන්තිකර්මයේ දී ද කුල්ල යොදාගැනෙන "කුල්ලේ පිදේනිය පිදීම" නමැති චාරිත්‍රයක් සිදුකෙරේ. මෙහි දී කුල්ල මත බත්, ව්‍යංජන, පඬුරු 132ක්, මල්, බුලත් ආදිය තබා,

රොඩියා පෙර මඟට - කුල්ලත් අරන් එන කොට
පැන්න බිසවුන් හට - ගත්තු කුල්ලෙන් බිසව් මෙකරට
රිද්දි බිසවුන්ගේ - සමඟ කෙළි පුද ගන්නේ
සෑම දෙවි තෙදින්නේ -අණින් කරනන්වල්ල එන්නේ

යනාදි වශයෙන් රොඩී බිසොවුන්ට මන්තර කියා ආරාධනා කරමින් ආතුර කාන්තා පාර්ශ්වයට සෙත්-ශාන්තිය ප්‍රාර්ථනා කිරීම සිදුවේ.

### කිරිමඩු ශාන්තිකර්මය

භෞතික වශයෙන් කිරි දීමෙන් ද අභෞතික වශයෙන් දිරි දීමෙන් ද මෙරට ගැමියන්ගේ ජීවිතය හා ඓන්ද්‍රියව සම්බන්ධ ගව සම්පතෙහි ආරක්ෂාව හා බෝවීම වර්ධනය කරගැනීමේ අරමුණින් පැවැත්වෙන මේ ශාන්තිකර්මයේ දී "කිරිමඩුව කෙරෙන භූමියේ වංගෙඩිය, මෝල්ගහ සහ වී කුල්ල තබයි. මෙම වී ප්‍රදේශයේ බැතිමතුන්ගෙන් එකතු කර ගන්නා ලද ඒවා ය. වී මත හඳුන් කිරි පැණි ගොටුවකි. කුල්ලට පිටතින් ඒ ආසන්නයේ බුලත්, කහ සහ දෙහි තබා" (Liyanage, 1998, p. 111) ඒ වී කුල්ල මත කිරි උතුරුවන මුට්ටිය ද තබා අග කෙළවර පිටතට සිටින ලෙස තැබූ බුලත් කොළ තුනක් මත දෙහි ගෙඩියක්, කුඩා දේවාභරණයක් වූ හෙල්ල සහ පොල්තෙල් පහනක් තැන්පත් කෙරේ. පසුව එම ස්ථානයේ සිටින අය විසින් කුල්ලේ ගොඩ ගසා ඇති වී මිට බැගින් ගෙන එය සුවඳ දුමට අල්ලා සකස් කර ඇති ගොටුවකට දමනු ලැබේ. එහි දී ප්‍රධාන ඇදුරා බිම ඉඳගෙන යාදිනි කවි කියමින් ගොටුවට දුම්මල අල්ලා සෙත්-ශාන්ති සිදු කරයි.

### ගරා යක් කංකාරිය

"කිසි විටෙකත් යක්ෂ ගණයට අයත් නොවන යක්ෂයින්ට වඩා ඉහළ කොට්ඨාසයක සිටින රාක්ෂ නම් වූ කොට්ඨාසය සමඟ කටයුතු කරන මිනිසාට අහිතකර දෙයක් නොකරන" (Kottagoda, 1995, p. 19) "සංඛ්‍යාත්මකව දොළහක්" (Sarachchandra, 1968, p. 43) වන ගරායකුම පැවැත්වෙන්නේ වස්දොස් දුරු කිරීමේ අරමුණෙනි. බත්, කැවුම්, කෙසෙල්, රොටී, හත් මාලු, හත් ඇඹුල්, රත් මල්, ගොඩමස්, දිය මස්, බිත්තර බැදුම යනාදිය කුල්ලට තබා ගරා යකුන් වෙත පුද කෙරෙන කුල්ලේ පිදීමේ අවස්ථාව සඳහා ඍජු ව ම කුල්ල යොදා ගැනේ.

### කුලු බලිය

පූජාර්ථය අරමුණු කොට නවග්‍රහයින්ගෙන් සිදුවන අපල උපද්‍රවයන්ගෙන් මිදී සෙත්ශාන්තිය අපේක්ෂාවෙන් සිදුකෙරෙන (Department of Cultural Affairs, 1990, p. 139) බලිශාන්තිකර්මය උඩරට, පහතරට හා සබරගමු යන සම්ප්‍රදාය ත්‍රිත්වයට ම අයත් එකිනෙකට වෙනස් වූ ලක්ෂණ ප්‍රකට කෙරෙන ශාන්තිකර්ම විශේෂයකි.

"වැලිබලි මල්බලි කඩබලි අත්බලි
කුළුබලි මැටිබලි බත්බලි ග්‍රහබලි
යුගබලි වස්බලි වරුසෙට හිම්බලි
දැනගන් ඇදුරනි මේ පන්තිස් බලි"
(Sedaraman, 1967, p. 215).

පූර්වෝක්ත පද්‍යයට අනුව තිස්පහක් වන බලි වර්ග අතර කුලුබලිය ද වේ. කුල්ල මත බත්වලින් තැනු බලි "කුලු බලි" ලෙස හඳුන්වන බව ද සඳහන් වේ. බේකරිවල කෑම වර්ග සකසනු ලබන මේසය මත රැඳුණු අවශේෂ පිටි සූරා ගැනීමෙන් සකසන තෙල් සහිත පිටි ගුළිය මාංශ ගුලිය නම් වේ. ඒ අනුසාරයෙන් කුඩා ළමා රූපයක් සකසා කුල්ල මත තබා සෙත් ශාන්ති කරනු ලැබේ. එය මාංශ බලි වශයෙන් හඳුන්වනු ලැබුව ද කුලු බලි වෙසෙසට අයත් බව සබරගමු බලි ඇදුරන්ගේ විශ්වාසයයි" (Kumarathunga, 2006, p. 131). මෙය කුඩා දරුවන්ගේ බාලගිරි දෝෂයට සිදු කරනු ලබන බලි විශේෂයක් බව පැවසේ.

**මීදුන් අත්තම්මා පිදීම**

ශාන්තිකර්ම ගණයට අයත් නොවන මෙය මීදුන් අත්තම්මා පිදීම, කුණු ටිකිරට බත් දීම, කුණු මුත්තා පිදීම, කුණු මුල්ල පිදීම, ජපන් අම්මා පිදීම, මීදුන් අම්මා පිදීම, අළු බොක්ක පිදීම යනාදී නම්වලින් ද හැඳින්වීම අනුව ප්‍රදේශීය විෂමතාවලින් ගහන සිංහල-හින්දු අලුත් අවුරුද්ද හා තදනුබද්ධ චාරිත්‍රවිධියකි. මෙහි දී සිදුකෙරෙන්නේ මුළුතැන්ගේ ඉතිරි වී ඇති රොඩු සියල්ල එකතු කර වන ලැහැබට ගොසින් මීදුන් අත්තම්මා නමින් පූජාකිරීමයි. අවුරුදු කෝණම සඳහා කැවිලි-පෙවිලි තැනීමේ දී ඉතිරිවන කුණු රොඩු මේ කුණු මුත්තාට අයිති බව සත්කෝරල වැසියන් අතර පුරාණයේ සිට පැවත එන සම්මතයකි. සත්කෝරල ප්‍රදේශයේ අතීත ගැමි කාන්තාවන් විසින් කුල්ල මතට කෙසෙල් කොළයක් එළා සියලු කුණු රොඩු එකතු කර එයට දමා ගනු ලැබේ. ලිප් බොක්කේ අළුත්, කුස්සියෙන් එළියට දැමීමට එකතු කර මුල්ලක ගොඩ ගසා ගත් කුණුත්, අවුරුද්දට සකස් කර ගත් කැවිලි වර්ගත් මීට අන්තර්ගත වේ. "මෙලෙසින් කුණු මුත්තාගේ කලම්පන්න සූදානම් කර ගෙවිලිය හැන්දෑකරයේ ඒ කියන්නේ ඉර හැරුණට පසුව මෙම කුණු පිරවූ කුල්ල ගෙන ගොස් බැද්දට දමනවා. ගංකරයෙන් ඔබ්බට තියෙන වන රොදකට ගෙන ගොස් මංකඩයක්, අඩි පාරක් නොවන මිනිස් පය නොපෑගෙන තැනක බිමින් තියනවා. පසුව "ඕං මේ වංගියේ අපේ ලිප් බොක්ක කුණු මුත්තාට භාරයි." කියා ආපිට හැරිලා එනවා. ඒ එන ගමන් වැවේ මංකඩෙන් හෝ දොළකින් හෝ අත් පා සෝදා ගත යුතුය" (Dalupotha, 2011, p. 37) යනාකාරයෙන් සිදුකෙරෙන මේ මීදුන් අත්තම්මා පිදීම නමැති චාරිත්‍රය සාම්ප්‍රදායික සිංහලයින් විසින් පරිසර හිතකාමී ආකාරයට කුණු බැහැර කිරීමට සකසා ගැනුණු ක්‍රමෝපායයක් වශයෙන් ද හඳුන්වාදීමේ හැකියාව පවතී.

**කුල්ල හා බැඳි සංකේත**

සාම්ප්‍රදායික සිංහලයින්ගේ භෞතික හා අභෞතික සංස්කෘතිය හා අත්‍යන්තයෙන් ම බැඳී පවතින මෙවලමක් වන කුල්ල මඟින් පැවසෙන සංකේත ගණනාවක් ද වේ. කමතේ සිට නිවෙසට පවිත්‍ර වූ වී රැගෙන ඒමට උපකාරීවන, අභෞතික සංස්කෘතියට අයත් අංග ගණනාවක් සමඟින් අත්‍යන්තයෙන් සම්බන්ධ වන, ගෘහිණියගේ විවිධ විෂයක අවශ්‍යතා පිරිමසාලන කුල්ල සෞභාග්‍යයේ සංකේතයයි. දෛනික ජීවිතයේ විවිධ අවශ්‍යතා පිරිමසාලූ කුල්ල ශුභා ශුභ දෙපාර්ශ්වයෙන් ම සංකේත ගණනාවක් ජනනය කරවයි. කුල්ලෙහි දමා කිසිවක් පොළන විට කිසියම් පුද්ගලයකු ඒ ඉදිරියෙහි සිටගෙන සිටීම අශුභ සංකේතයක් වශයෙන් පැරැන්නෝ සැලකූහ. පොළන කුල්ල ඉදිරියෙන් සිටගෙන සිටීමෙන් කුල්ලෙන් ඉවත් වන අපද්‍රව්‍ය ඇස් ඇතුළු ශරීරාවයවවල දැවටීමෙන් අනතුරු සිදුවීමට ඇති අවකාශය හා කුල්ල සෘජුව ම ශරීරයේ වැදීමෙන් අනතුරු සිදුවීමට ඇති අවකාශය ප්‍රකාශ කිරීම සඳහා මෙම සංකේතය ගැමියන් විසින් නිර්මාණය කරගන්නට ඇතැයි සිතිය හැකි ය.

කුල්ල මත වැඩිහිටියකු වාඩිවීම සැලකෙනුයේ ද අශුභ සංකේතයක් වශයෙනි. කුල්ල බුද්ධ භෝග තැන්පත් කිරීම වැනි පූජාර්හ කටයුතු විෂයෙහි යොදා ගැනුණු බැවින් ඊට ගෞරව කිරීම සඳහාත් වැඩිහිටියකු වාඩිවීමෙන් කුල්ලේ කල්පැවැත්මට බාධාවක් සිදුවන නිසාත් මෙය අශුභ සංකේතයක් වශයෙන් ගැමියන්ගේ ව්‍යවහාරයට ප්‍රවිෂ්ට වන්නට ඇත. "හාල් පොළන විට කුල්ල අතැරීම අශුභ නිමිත්තක්" (Helagosa, 2007, p. 108) වශයෙන් සැලකීමට හේතු වන්නට ඇත්තේ සකසුරුවම හා කුල්ලෙන් පෙළෙන භව-භෝගවල ආරක්ෂාව යන කරුණු වන්නට ඇත. එහෙත් ඇතැම් ප්‍රදේශවල "වී හෝ සහල් පොලන අවස්ථාවේ කුල්ල අතින් ලිස්සා යෑම ද හාල් ගරන විට නැඹිලිය අතින් ගිලිහී යෑම ද පෙර නිමිති වශයෙන් සැලකේ. එදින හවස් වීමට පෙර කිසියම් නෑයෙකුගේ හෝ හිතවතෙකුගේ පැමිණීම මෙකී නිමිත්තේ ඵල ලෙස දැක්වේ" (Chandana, 1992, p. 118). මෙහි දී කුල්ල අතැරීම ශුභ සංකේතයක් වශයෙන් ද සැලකී ඇති බව පෙනේ.

වංගෙඩිය මත කුල්ල තැබීම ද පිළිගැනුණේ අශුභ සංකේතයක් වශයෙනි. ඊට හේතු වන්නට ඇත්තේ එම භාවිතය ශාන්තිකර්ම සිදු කරන අවස්ථාවන්හි සිදු කිරීම නිසාත් වංගෙඩිය මත කුල්ල තැබීමෙන් එය බිමට පතිත වී කැඩී-බිඳී යාමේ අවදානමක් පවතින නිසාත් වන්නට ඇත.

කුල්ලට පලාවර්ග දැමීම කුල්ලෙන් පිරිමැසෙන භෞතික අවශ්‍යතාවක් වශයෙන් සැලකුණත් එය අශුභ සංකේතයක් වශයෙන් ද ව්‍යවහාරයට පැමිණ තිබේ. පලාවර්ග තෙත සහිත වීම නිසා එම තෙත කුල්ලට උරා ගැනීමෙන් කුල්ල දිරාපත්වීමෙන් වළක්වා ගැනීම මෙබඳු සංකේත භාවිතයට පැමිණෙන්නට හේතු වන්නට ඇත.

**කුල්ල හා බැඳුණු පිරුළු**

කුල්ල හා බැඳුණු ජනකවි හා ජනකතා ඇතුළු ජනශ්‍රැති ගණනාවක් වේ. කුල්ල හා බැඳුණු පිරුළු ද රාශියක් පවතී. ඉන් කිහිපයක් පහත පරිදි වේ. රොඩියගේ පැලේ කුලු හිඟ ද?, කුල්ලෙන් පෙළුවා වගේ, තම්බියා දීපු කුලු දෙක වගේ, ස්ත්‍රීයකගේ හැඩ පේන්නේ කුල්ලෙන් පොලන කොටලු, රොඩියගේ කුල්ල වගේ, අටුවේ වී තියනවා නම් ගම මහගේ කුල්ල කොයි පැත්තෙන් පෙළුවාම මොකද?, ඇත්තු කුඹුරු

විනාශ කළාම ගමේ මිනිස්සු ගෙදර තිබ්බ වංගෙඩි කුලුත් බැන්දාලු, අලියගේ කන් කුල්ලක් වගේ, රොඩියා රවට්ටා කුල්ල හැදෙව්වා වගෙයි, මයිනහම වෙනුවට කුල්ල අතට ගත්තා වගේ, කුලු ගේන්න රොඩී ගමටම ගියාද?, කුල්ල දොරට හේත්තු කළා වගේ, ඇතා වැහැරුණත් කුල්ලෙන් වහන්න බැරිලු, පොලන්නේ සුවඳැල් වුණත් මොකටද කුල්ල කුඩම්මා අතේ නම්, කුල්ල බතේ රහ දන්නෑ වගේ, අනුන්ගේ කුල්ලට වඩා තමන්ගේ අල්ල හොඳයිලු, කුල්ල යවලා හොරා ඇල්ලුවා වගේ, රොඩියගේ ගෙදර ගිහින් කුල්ලක් නොගෙනාවා වාගේ, රොඩී ගමට ගිහින් කුල්ලක් ගන්න අමතක වුණා වගේ, කුල්ලෙන් පේන කිව්වා වගේ, නිකම් යන්න බැරි පාරේ හුණු කුල්ලකුත් කරේ තියන් ගියා වගේ, කුල්ලේ දාලා ඉඳගෙන කන්ඩ කෑම තිබුණලු, තුත්තුකුඩි ගියත් කුල්ල කුල්ලමයි, කුල්ලේ දාලා කී රොටී බෙදුවා වාගේ, කුල්ල තිබියදි අල්ලෙන් පොලන්නා වාගේ, කුල්ල රොඩියගේ උනත් රදවගේ කුස්සියෙත් තියනවලු, රදලයා පොලන්නෙත් රොඩියගේ කුල්ලෙන්, ලිපේ තියන අළු කුල්ලට ගන්ට රොඩියගේ අවසර මොකටද?, කුල්ල ඉහළා වැස්ස නතර කළා වගේ, පොලන් කාපු කුල්ල කුණු ගොඩට දැම්මා වගේ, ගැටිය ගැලවුණ කුල්ල වගේ, කඩි ගුල මැදට අළු කුල්ලක් දැම්මා වගේ, අනුන්ගේ හාල් පොලන්ට ගිහින් තමන්ගේ කුල්ල කඩා ගත්තා වගේ, රොඩියට කුල්ලේ හැඩ කියා දෙන්ට ගියා වගේ, පැල අල්ලන කුල්ලට දෙපැලක් මැන්නා වගේ, කුස්සියේ කුණු කුල්ලෙන් වහන්නා වගෙ, හුළඟ තියන වේලාවට ඕනේ කුල්ලෙන් පොලන්ඩ, කුල්ලක් පිරෙන්ඩ කොළ කඩලා අල්ලක් තරම් මැල්ලුමක් හැදුවලු, කුල්ලේ ගොම ගෑවිලාම ගියා වගේ, කුල්ල ඇටෙව්වා වගේ, නවරියන් ගෙයක් අතුගාන කොට කුණු කුල්ලක් එක්කාසු වෙනවලු, රොඩියගේ ගෙදර කුල්ලක් නෑ වගේ, රොඩියට කුල්ලක් තෑගි දුන්නා වගෙයි, කුල්ලේ දෙකෙළවර වගෙයි, ඒරොප්පෙට ගෙනිච්චත් රොඩියා කුලු හදනවලු, කුල්ල හොරු ගත්තාට රොඩියා පළිද?, නිකම් යන්න බැරි ඉනිමගේ හුණු කුල්ලකුත් බදාගෙන යන්නා වාගෙයි.

සාම්ප්‍රදායික සිංහලයින් සතු බහුතරයක් උපකරණ, මෙවලම්, ඇඳුම්-පැළඳුම්, යාන-වාහන වැනි භෞතික සංස්කෘතිකාංග මෙන් ම චාරිත්‍ර-වාරිත්‍ර, කලාව, දර්ශනය වැනි අභෞතික සංස්කෘතිකාංගවල ප්‍රභවය බුද්ධාගම හා වැව කේන්ද්‍රීය ව සිදු වී තිබේ. කුල්ල ද මෙරට වැව් ප්‍රතිෂ්ඨාපනය වීමෙන් අනතුරුව ව්‍යාප්ත වූ කෘෂිකාර්මික සංස්කෘතිය හා සබැඳි භෞතික නිර්මාණයක් වශයෙන් උපත ලබා අභෞතික සංස්කෘතිය ද නියෝජනය කරමින් පොදුජනයා ඇසුරේ පවතින මෙවලමකි. ඒ අනුව මිනිසා විසින් නිර්මාණය කරගැනෙන භෞතික මෙවලමක් මඟින් සංස්කෘතියක කෙතරම් පෘථුල පරාසයක් අධ්‍යයනය කළ හැකි ද යන්න නිශ්චය කළ හැකි ය. "මිනිසා, මිනිසා බවට පත් වූයේ උපකරණ මඟිනි. උපකරණ තැනීම හෝ නිෂ්පාදනය මඟින් ඔහු තමා ම නිර්මාණය වූයේය; නැතහොත් නිෂ්පාදනය වූයේ ය" (Helagosa, 2007).

## නිගමන හා නිර්දේශ

කුල්ල නමින් හැඳින්වෙන ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික මෙවලම පිළිබඳ සිදුකෙරුණු මෙම පර්යේෂණය මඟින් සිංහල ජනතාවගේ සංස්කෘතික උරුමය සහ දෛනික ජීවිතය අතර ඇති සංකීර්ණ සම්බන්ධතා පිළිබඳ වටිනා අවබෝධයක් සැපයෙයි. ඓතිහාසික ග්‍රන්ථ, කෞතුක වස්තු සහ භාෂාමය සාක්ෂි පරීක්ෂා කිරීමෙන් කුල්ල ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භාවිතයන් තුළ පමණක් නොව පුළුල් සමාජ සංස්කෘතික සන්දර්භය තුළ ද සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ බව පෙනේ. උපයෝගිතා ක්‍රියාකාරකම් සහ සංකේතාත්මක අර්ථයන් යන අංග ද්වය සමග ම මේ මෙවලම සම්බන්ධ වීම ඔස්සේ සිංහල ප්‍රජාවගේ සාම්ප්‍රදායික ජීවන රටා සහ සංස්කෘතික අනන්‍යතාව අවබෝධ කර ගැනීමේ අනුපූරක මූලාශ්‍රයක වටිනාකම එයට ආරෝපණය කළ හැකි ය.

පැරණි ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාර දක්වා දිවෙන කුල්ලෙහි ඓතිහාසික මූලයන් මඟින්, සියවස් ගණනාවක් පුරා එහි පවතින කල් පවත්නා පැවැත්ම සහ අනුවර්තනය ඉස්මතු කෙරෙයි. කුල්ලෙහි බහුවිධ කාර්යභාරය සහ සංස්කෘතියේ ස්පර්ශනීය හා අස්පර්ශනීය අංශ අතර හිඩැස පූරණය කිරීමට ඒ මඟින් සැපයෙන දායකත්වය මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරෙයි. කෘෂිකාර්මික කටයුතු, ගෘහස්ථ ක්‍රියාකාරකම් සහ සාහිත්‍ය හා ජනප්‍රවාද තුළ එහි නියෝජනය විමර්ශනය කිරීමෙන්, පර්යේෂණ මගින් සංස්කෘතික භාවිතයන් හැඩගැස්වීම සහ පිළිබිඹු කිරීම සඳහා ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික මෙවලම්වල සාකල්‍ය ස්වභාවය අවධාරණය කෙරෙයි.

නූතන මෙවලම් භාවිතයට පවතින සීමාන්තික ඇබ්බැහිකමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලාංකේය ජනතාව සාම්ප්‍රදායික භාණ්ඩ, උපකරණ මෙන් ම මෙවලම් හා තදනුබද්ධ සංස්කෘතිකමය සාක්ෂරතාවෙන් දුරස් වෙමින් සිටියි. ස්වකීය ජීවන සංස්කාරානුබද්ධ ව උකහා ගැනුණු ජන විඥානය ප්‍රයෝජනයට ගනිමින් පැරැන්නන් විසින් නිර්මාණය කර ගැනුණු පූර්වෝක්ත භාණ්ඩ, උපකරණ හා මෙවලම් නැවත භාවිතයට ගැනීමත් සංරක්ෂණය කිරීමත් සම්බන්ධයෙන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ උපාය මාර්ග වෙත යොමුවීමේ කාලීන අවශ්‍යතාව ඉස්මතු වී තිබේ. මේ පර්යේෂණය හා බද්ධ වූ කුලු කර්මාන්තය කෙරෙහි ද ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම මෙරට ආර්ථික හා සංස්කෘතික දේහය ශක්තිමත් කිරීමකි. එහි දී කුලු නිෂ්පාදනයෙහි නිරත වන්නන් ව්‍යවසායකයින් බවට පත් කිරීම, ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළ හා ඔවුන් සම්බන්ධ කරවීම, කලාපීය හා ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රදර්ශන වෙත ඔවුන්ගේ භාණ්ඩ යොමු කරවීම වැනි ක්‍රියාමාර්ග ඔස්සේ ඔවුනට ආර්ථික, සමාජ හා සංස්කෘතික වටිනාකමක් ලබා දීමට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත් වීම බෙහෙවින් ම ඵලදායක වනු ඇත. අවසාන වශයෙන්, මෙම පර්යේෂණය ඓතිහාසික හා සංස්කෘතික ආඛ්‍යාන අවබෝධ කර ගැනීමේදී සාම්ප්‍රදායික මෙවලම්වල අදාළත්වය අවධාරණය කරමින් ශ්‍රී ලංකාවේ අනන්‍ය සංස්කෘතික උරුමය සුරැකීමට සහ අගය කිරීමට දායක වේ.

## REFERENCES

Baker, S. W. (2004). *Lak wanasariye ata wasak* [Eight Years' Wanderings in Ceylon]. (K. Wanigasooriya, Trans.). Sooriya Publishers. (Original work published 1874)

Brohier, R. L. (2002). *Brohier hadunagath Lankawa* (A. Hewawasam, Trans.). [Discovering Ceylon]. Sooriya Publishers. (Original work published 1973)

Chandana, O. (1992). *Nuwara kalawiye nimithi* [Signs of the Nuwara Kalawiya]. Pethikada Publishers.

Coomaraswamy, A. K. (1962). *Madya kaleena Sinhala kala*. [Mediaeval Sinhalese art]. Department of Cultural Affairs, Sri Lanka.

Dalupotha, M. K. (2002). *Kamathe wathagotha* [Details of the threshing floor]. Godage Publishers.

Dalupotha, M. K. (2003). *Watapila* [Circular veranda]. Godage Publishers.

Dalupotha, M. K. (2011*). Awurudu wathagotha* [Details of the new year]. Fast Publishing.

Department of Cultural Affairs. (1990). *Bali yagaya*. In *Sinhala Shabdhakoshaya* [Sinhala Dictionary] (p. 139).

Dissanayake, M. (1998). *Gami nataka praweshaya* [An introduction to folk drama]. Godage Publishers.

Dissanayake, M. (2004). *Killa ha kotahaluwa* [Impurity and puberty ritual]. Godage Publishers.

Dissanayake, M. (2010). *Gami nataka praweshaya* [An introduction to folk drama]. Godage Publishers.

Geiger, W. (2018). *Mahavamsa: The great chronicle of Ceylon* (5th ed.). Buddhist Cultural Center.

Gunasoma, G. (2002). *Gami gedara muluthangeya* [The country-side kitchen]. Godage Publishers. *Helagosa* (2007). Sesatha Publishers.

Ihalagama, S. (1997). *Padura ha Sinhala jana jeewithaya* [The mat and the life of Sinhalese]. Godage Publishers.

Jayathilaka, Y. D. (1993). *Malwara siritha* [The customs of attainment of puberty]. Author.

Kahandagamage, P. (1991). *Kethaka mahima Kamatha.* [wonderfulness of field the threshing floor]. Ariya Publishers.

Kahandagamage, S. (1999). *Jeewa danayen mathaka danayata* [From the gift of life to the gift of memory: An analysis literary and cultural aspects of the funeral]. Godage Publishers.

Kariyawasam, T. (1995). *Ratayakum yaga wigrahaya* [An analysis of the traditional healing ritual Ratayakum Yaga]. Godage Publishers.

Karunarathna, D. M. H. (2001). *Udarata kadawara shanthikarmaya* [Kandyan Kadawara healing ritual]. Tharanjee Printers.

Kluckhohn, C. (1949). *Mirror for man: The relation of anthropology to modern life*. Whittlesey House.

Kottagoda, J. (1995). *Pahatharata shanthikarma sahithya* [Literature related to low country healing rituals]. Godage Publishers.

Kottagoda, J. (1998). *Kalu kumaraya puda labana daraka wath piliweth* [Filial rituals in worshiping the demon named Black Prince]. J.K. Publications.

Kroeber, A. L., & Kluckhohn, C. (1952). *Culture: A critical review of concepts and definitions* Peabody Museum Press.

Kumarasinghe, W. (2006). *Vangala valiththan: Nuwarakalaviye paramparika janashruthi, janapravada, adahili ha janakavi* [Traditional folklore, legends, records, and folk poetry of Nuwarakalaviya]. Chaga Publishers.

Kumarathunga, S. (2006). *Sabaragamu bali yaga piliwela* [The methods of the Sabaragamuwa bali yaga]. Self-published.

Leach, E. R. (Ed.). (1961). *Rethinking anthropology*. Robert Cunningham & Sons.

Liyanage, B. (1998). *Sabaragamu kirimadu shanthikarmaya saha mangara dewiyo* [ Sabaragamuwa kirimadu healing ritual and the god Mangara]. Author.

Liyanage, S. (1996). *Jana Vidya Shabdhakoshaya.* [Dictionary of folklore]. Godage Publishers

Mahawanmsa (2nd ed.). (2004). Buddhist Cultural Center..

Manewa, K. B. (2004). *Nuwara kalawiye jana mangalla.* [The folk festivals of the Nuwara Kalawiya]. Godage Publishers.

Maung, P. P. (2023). The importance of culture in society. *Sagaing University Research Journal, 9*, 1–6.

Medhananda Himi, E. (2006). *Sinhale maharajawansaya: Vol. 1* [The great Sinhalese dynasty: Vol. 1]. Dayawansa Jayakody Publishers.

Peiris, R. (2005). *Sihnala samaja sanvidanaya* [Sinhalese social organization]. Visidunu Publishers.

Raghawan, M. D. (2008). *Rathnawalliyage daruwo: Rodi jana puranaya* (C. Ranasinghe, Trans.). [Handsome beggars: Story of the Ceylon Rodiya]. Visidunu Publishers. (Original work published 1956)

Ryan, B. (2015). *Sinhala samajaye kula kramaya* (C. Ranasinghe, Trans.). [Caste in Modern Ceylon]. Godage Publishers. (Original work published 1953)

Sarachchandra, E. (1968). *Sinhala gami natakaya* [Sinhala folk drama]. Godage Publishers.

Sedaraman, J. E. (1967). *Baliyaga wicharaya nohoth lankawe bali upatha* [Analysis of Bali or the Birth of Bali in Sri Lanka]. M. D. Gunasena.

Senaratne, P. M. (1994). *Bakmaha asiriya* [The splendour of the month of Bak]. Godage Publishers.

Siripala, N. (2006). *Sinhala jana kawiye samaja dharshanaya* [The social philosophy of Sinhala folk poetry]. Godage Publishers.

Sirisena, K. (2006*). Sinhala janakawi* [Sinhala folk poetry]. Sarasavi Publishers.

Smelser, N. J. (1984). *Sociology*. Prentice-Hall.

Soratha Himi, W. (1998). *Kemkrama* in *Sri Sumangala Shabdhakoshaya* [Sri Sumangala dictionary]. (2nd ed., p. 292). Godage Publishers.

Tambiah, S. J. (2011). *Polyandry in Ceylon, with special reference to the Laggala region.* Social Scientists' Association.

Tylor, E.B. (1871). *Primitive culture.* John Murray.

University of Kelaniya**.** (1964). *Lanka viswavidyalaye Lanka ithihasaya* [History of Sri Lanka at the University of Sri Lanka, Vol. 1].

Wickramasinghe, M. (2006). *Sinhala lakuna* (6th ed.) [Sinhala sign]. Sarasa Publishers.

Wijayathunga, H. (1998). *Neethi niganduwa* [Interpretations in law]. Godage Publishers.

Wijesekara, N. (1949). *Lanka janathawa* [The people of Sri Lanka]. M. D. Gunasena.

Wijesekara, N. (1955). *Lanka janathawa* [The people of Sri Lanka]. M. D. Gunasena.